# රණවිරුවා

2021 මැයි • 229 කලාපය




මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

# රණවිරුවා

2021 මැයි • 229 කලාපය



## ජාතික රණවිරු සැමරුම

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.



# ඓතිහාසික දිනයේ ගෞරවනීය ආවර්ජනය...

රටේ ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාව සහ ස්වාධීනත්වය උදෙසා සිය වටිනා ජීවිත පරිත්‍යාග කළ යුද, ගුවන් හා නාවික හමුදාවේ, පොලිසියේ සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වීරෝදාර රණවිරුවන්ගේ සදාතනික මතකයන් සහ වීරත්වය සිහිපත් කිරීමේ 12 වන ජාතික රණවිරු සැමරුම් උත්සවය පසුගිය මැයි 19 වන දින සන්ධ්‍යාවේ **බත්තරමුල්ල ජාතික රණවිරු ස්මාරකය** අභියසදී පැවැත්විණ.

මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සන්නද්ධ හමුදා සේනාධිනායක අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් සහභාගි වූ අතර ගරු අග්‍රාමාත්‍යතුමන්, බස්නාහිර පළාත් ආණ්ඩුකාර, ජනාධිපති ලේකම්, ආරක්ෂක ලේකම්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති, නාවික හා ගුවන් හමුදාධිපතිවරු, පොලිස්පති, රණවිරු සේවා අධිකාරියේ සභාපති සහ රට වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුන්ගේ ආදරණීය ඥාතීන් රැසක් සහභාගි වූහ.

2009 මැයි මාසයට පෙර එල්ටීටීඊ ත්‍රස්තවාදීන් සමග පැවති කුරිරු යුද්ධයේදී මාතෘ භූමියේ ඒකීයභාවය සහ ස්වෛරීභාවය ආරක්ෂා කිරීම උදෙසා සිය ජීවිත පූජා කළ යුද්ධ හමුදාවේ 23,962, නාවික හමුදාවේ 1160, ගුවන් හමුදාවේ 443, පොලිසියේ 2598 සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 456 ක් වූ වීරෝදාර රණවිරුවන් මෙම ඓතිහාසික අවස්ථාවේ සිහිපත් කළහ.



# ඓතිහාසික දිනයේ ගෞරවනීය ආවර්ජනය...



රටේ ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාව සහ ස්වාධීනත්වය උදෙසා සිය වටිනා ජීවිත පරිත්‍යාග කළ යුද, ගුවන් හා නාවික හමුදාවේ, පොලිසියේ සහ සිවිල් ආරක්‍ෂක දෙපාර්තමේන්තුවේ වීරෝදාර රණවිරුවන්ගේ සදාතනික මතකයන් සහ වීරත්වය සිහිපත් කිරීමේ 12 වන ජාතික රණවිරු සැමරුම් උත්සවය පසුගිය මැයි 19 වන දින සන්ධ්‍යාවේ **බත්තරමුල්ල ජාතික රණවිරු ස්මාරකය** අභියසදී පැවැත්විණ.

මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සන්නද්ධ හමුදා සේනාධිනායක අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්‍ෂ මැතිතුමන් සහභාගි වූ අතර ගරු අග්‍රාමාත්‍යතුමන්, බස්නාහිර පළාත් ආණ්ඩුකාර, ජනාධිපති ලේකම්, ආරක්‍ෂක ලේකම්, ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති, නාවික හා ගුවන් හමුදාධිපතිවරු, පොලිස්පති, රණවිරු සේවා අධිකාරියේ සභාපති සහ රට වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුන්ගේ ආදරණීය ඥාතීන් රැසක් සහභාගි වූහ.

2009 මැයි මාසයට පෙර එල්ටීටීඊ ත්‍රස්තවාදීන් සමග පැවති කුරිරු යුද්ධයේදී මාතෘ භූමියේ ඒකීයභාවය සහ ස්වෛරීභාවය ආරක්‍ෂා කිරීම උදෙසා සිය ජීවිත පූජා කළ යුද්ධ හමුදාවේ 23,962, නාවික හමුදාවේ 1160, ගුවන් හමුදාවේ 443, පොලිසියේ 2598 සහ සිවිල් ආරක්‍ෂක දෙපාර්තමේන්තුවේ 456 ක් වූ වීරෝදාර රණවිරුවන් මෙම ඓතිහාසික අවස්ථාවේ සිහිපත් කළහ.


MP








MP













# කොවිඩ් මඩින මෙහෙවරට දැවැන්ත ශක්තියක් වෙමින් සීදුවෙහි විශාලතම කොවිඩ් රෝහල ඉදිවෙයි...

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ පූර්ණ දායකත්වයෙන් **සීදුවේ** ස්ථාපනය කරන ලද ඇඳන් 1200 කින් සමන්විත අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉකුත් මැයි 18 වන දින ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ ආරාධනයකට අනුව අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසින් නිරීක්ෂණය කරන







# කොවිඩ් මඩින මෙහෙවරට දැවැන්ත ශක්තියක් වෙමින් සීදුවෙහි විශාලතම කොවිඩ් රෝහල ඉදිවෙයි...

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ පූර්ණ දායකත්වයෙන් **සීදුවේ** ස්ථාපනය කරන ලද ඇඳන් 1200 කින් සමන්විත අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉකුත් මැයි 18 වන දින ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ ආරාධනයකට අනුව අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්‍ෂ මැතිතුමන් විසින් නිරීක්‍ෂණය කරන ලදී. "බ්‍රැන්ඩික්ස්" සමූහයේ ප්‍රධාන විධායක අධ්‍යක්‍ෂ අෂ්රෆ් ඕමාර් මහතාගේ අනුග්‍රාහකත්වය මත යුද්ධ හමුදා භටපිරිස් විසින් දින 10 කට අඩු කාලයකදී කොවිඩ්-19 වෛරසය ආසාදිත රෝගීන් සඳහා ප්‍රතිකාර සිදුකිරීමට වාට්ටු තුනකින් සමන්විත මෙරට ඉදිකළ විශාලතම අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානය එය වේ.

කොවිඩ් - 19 වෛරසයේ තෙවන රැල්ල රට තුළ ව්‍යාප්ත වෙමින් පවතින මෙවන් අවදියක ඕනෑම හදිසි අවශ්‍යතාවයකට මුහුණදිය හැකිවන පරිදි ස්ථාපිත කර ඇති මෙම රෝහල වෙතින් ආසාදිතයින් සඳහා සියලුම සෞඛ්‍ය පහසුකම් නොමිලේ සපයනු ලබයි. මෙම නව රෝහල හදිසි ප්‍රතිකාර ඒකකයක්, හෘදකලා කිරීමේ අංශ, පුනර්ජීවන අංශ, දැඩිසත්කාර ඒකක සහ ඖෂධ ශාලා ඇතුළු සියලුම සෞඛ්‍ය පහසුකම් වලින් සමන්විත වේ.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මැතිනියගේ පූර්ණ අධීක්‍ෂණයෙන් ස්ථාපනය කරන ලද මෙම අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය උපකරණ සහ රෝගීන්ගේ අනෙකුත් සියලුම අවශ්‍යතාවයන් සම්පාදනය කිරීමේ සියලු කටයුතුද එතුමියගේ සෘජු මැදිහත්වීම මත එම සේවා වනිතා ඒකකයේ සාමාජිකාවන්ගේ දායකත්වය මත ලබාදෙන ලදී.







# සීදුව කොවිඩ්-19 රෝහලේ නිරීක්‍ෂණයක්...

යුද්ධ හමුදාව විසින් වැඩිදියුණු කරන ලද **සීදුවේ** පිහිටා ඇති ශ්‍රී ලංකාවේ කොවිඩ් - 19 ආසාදිත රෝගීන් සඳහා වූ විශාලතම රෝහල පසුගිය මැයි 08 වන දින ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් විසින් නිරීක්‍ෂණය කළේය.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ පූර්ණ අනුග්‍රහය මත සියලුම සෞඛ්‍ය පහසුකම් සහිතව ඉදිකර ඇති මෙම නව රෝහල ඇඳන් 1200 කින් සමන්විත වන අතර එහි ඉදිකිරීම් කටයුතු "බ්‍රැන්ඩික්ස්" ආයතනයේ ප්‍රධාන විධායක අධ්‍යක්‍ෂ අෂ්රොෆ් ඕමාර් (Ashroff Omar) මහතාගේ විශේෂ අනුග්‍රාහකත්වය මත සිදුකෙරිණි. මෙම රෝහල ඉදිකිරීමේ විශේෂත්වය වන්නේ යුද්ධ හමුදා සාමාජිකයින් විසින් සතියක් වැනි කෙටි කාලයක් තුළ මෙහි ඉදිකිරීම් සහ වැඩිදියුණු කිරීමේ කටයුතු සිදුකිරීමයි. කොවිඩ් - 19 උවදුරට මුහුණදීම සඳහා ආසාදිතයින්ට ප්‍රතිකාර කිරීම වෙනුවෙන් ඇති ඇඳන් ප්‍රමාණය වැඩි කිරීමට රජය ගත් තීරණය අනුව කඩිනමින් ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව රෝහලේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් සිය උපරිම දායකත්වය සපයනු ලැබීය.




# සීදුව කොවිඩ්-19 රෝහලේ නිරීක්ෂණයක්...

යුද්ධ හමුදාව විසින් වැඩිදියුණු කරන ලද **සීදූවේ** පිහිටා ඇති ශ්‍රී ලංකාවේ කොවිඩ් - 19 ආසාදිත රෝගීන් සඳහා වූ විශාලතම රෝහල පසුගිය මැයි 08 වන දින ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් විසින් නිරීක්ෂණය කළේය.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ පූර්ණ අනුග්‍රහය මත සියලුම සෞඛ්‍ය පහසුකම් සහිතව ඉදිකර ඇති මෙම නව රෝහල ඇඳන් 1200 කින් සමන්විත වන අතර එහි ඉදිකිරීම් කටයුතු "බ්‍රැන්ඩික්ස්" ආයතනයේ ප්‍රධාන විධායක අධ්‍යක්ෂ අෂ්රෆ් ඕමාර් (Ashroff Omar) මහතාගේ විශේෂ අනුග්‍රාහකත්වය මත සිදුකෙරිණි. මෙම රෝහල ඉදිකිරීමේ විශේෂත්වය වන්නේ යුද්ධ හමුදා සාමාජිකයින් විසින් සතියක් වැනි කෙටි කාලයක් තුළ මෙහි ඉදිකිරීම් සහ වැඩිදියුණු කිරීමේ කටයුතු සිදුකිරීමයි. කොවිඩ් - 19 උවදුරට මුහුණදීම සඳහා ආසාදිතයින්ට ප්‍රතිකාර කිරීම වෙනුවෙන් ඇති ඇඳන් ප්‍රමාණය වැඩි කිරීමට රජය ගත් තීරණය අනුව කඩිනමින් ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව රෝහලේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් සිය උපරිම දායකත්වය සපයනු ලැබීය.









# පල්ලේකැලේ යුද්ධ හමුදා රෝහලේ ඉදිකිරීම් අවසන් අදියරට...

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ සංකල්පයකට අනුව **පල්ලේකැලේ 11 වන සේනාංක මූලස්ථාන පරිශ්‍රයේ** ඉදිකරමින් පවතින යුද්ධ හමුදා රෝහල් සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා ඉකුත් මැයි 23 වන දින එහි සංචාරයක නිරත වූයේය.



# පල්ලේකැලේ යුද්ධ හමුදා රෝහලේ ඉදිකිරීම් අවසන් අදියරට...

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ සංකල්පයකට අනුව **පල්ලේකැලේ 11 වන සේනාංක මුලස්ථාන පරිශ්‍රයේ** ඉදිකරමින් පවතින යුද්ධ හමුදා රෝහල් සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා ඉකුත් මැයි 23 වන දින එහි සංචාරයක නිරත වූයේය.

# ඉදල්කන්ද අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ඉදිකිරීම්වල ප්‍රගතිය ඇගයීමට...



ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාත්මක මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් තවත් නිලධාරීන් පිරිසක් සමග පසුගිය මැයි 27 වන දින හදිසි අවස්ථාවන්ට මුහුණදීම සඳහා **ඇල්පිටිය, ඉදල්කන්ද ප්‍රදේශයේ** ඉදිකරමින් පවතින අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයේ නිරීක්ෂණ චාරිකාවක නිරත වූහ. එහිදී අවසන් අදියරේ පසුවන ඉදිකිරීම් කටයුතු සොයා බැලූ හෙතෙම හටපිරිස් සමග එහි වත්මන් තත්ත්වය පිළිබඳව අදහස් හුවමාරුවක ද නිරත වූහ.







# ඉදල්කන්ද අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ඉදිකිරීම්වල ප්‍රගතිය ඇගයීමට...



ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් තවත් නිලධාරීන් පිරිසක් සමග පසුගිය මැයි 27 වන දින හදිසි අවස්ථාවන්ට මුහුණදීම සඳහා **ඇල්පිටිය, ඉදල්කන්ද ප්‍රදේශයේ** ඉදිකරමින් පවතින අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයේ නිරීක්ෂණ චාරිකාවක නිරත වූහ. එහිදී අවසන් අදියරේ පසුවන ඉදිකිරීම් කටයුතු සොයා බැලූ හෙතෙම හටපිරිස් සමග එහි වත්මන් තත්ත්වය පිළිබඳව අදහස් හුවමාරුවක ද නිරත වූහ.










# මුල්ලේරියාවේ ඉදිකළ විශේෂ දැඩි සත්කාර ඒකකය (SICU) විවෘත කෙරේ...



**මුල්ලේරියාවේ** පිහිටි නැගෙනහිර කොළඹ මූලික රෝහලේ ඉදිකළ දෙවන විශේෂ දැඩි සත්කාර ඒකකය (SICU) ඉකුත් මැයි 21 වන දින ගරු සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍ය පවිත්‍රා දේවි වන්නිආරච්චි මහත්මිය, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ සෙලාන් බැංකු ප්‍රධාන විධායක නිලධාරී/අධ්‍යක්ෂ කපිල ආරියරත්න මහතා එක්ව විවෘත කෙරිණ. නැගෙනහිර කොළඹ මූලික රෝහල සඳහා දිගුකාලීන අවශ්‍යතාවයක්ව පැවති මෙම විශේෂ දැඩි සත්කාර ඒකකය තුළ කොවිඩ්-19 වෛරසය ආසාදිතයින්ට ප්‍රතිකාර කිරීම සඳහා ඇඳන් 150 කින් සමන්විත වාට්ටු 8 ක් ස්ථාපිත කර ඇත.

සෙලාන් බැංකු කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව එහි මූලික අනුග්‍රාහකත්වයෙන් 1 වන ඉංජිනේරු සේවා බලකායේ තාක්ෂණික දැනුම සහ ශ්‍රමදායකත්වය ඇතිව මෙම විශේෂ දැඩිසත්කාර ඒකකයේ ඉදිකිරීම් කටයුතු සිදුකරන ලදී. එමගින් රාජ්‍ය භාණ්ඩාගාරයෙන් වැය කිරීමට සිදුව තිබූ විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි කරගැනීමට හැකියාව ලැබී ඇත.








# මුල්ලේරියාවේ ඉදිකළ විශේෂ දැඩි සත්කාර ඒකකය (SICU) විවෘත කෙරේ...

**මුල්ලේරියාවේ** පිහිටි නැගෙනහිර කොළඹ මූලික රෝහලේ ඉදිකළ දෙවන විශේෂ දැඩි සත්කාර ඒකකය (SICU) ඉකුත් මැයි 21 වන දින ගරු සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍ය පවිත්‍රා දේවි වන්නිආරච්චි මහත්මිය, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාත්මක මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ සෙලාන් බැංකු ප්‍රධාන විධායක නිලධාරී/අධ්‍යක්ෂ කපිල ආරියරත්න මහතා එක්ව විවෘත කෙරිණ. නැගෙනහිර කොළඹ මූලික රෝහල සඳහා දිගුකාලීන අවශ්‍යතාවයක්ව පැවති මෙම විශේෂ දැඩි සත්කාර ඒකකය තුළ කොවිඩ්-19 වෛරසය ආසාදිතයින්ට ප්‍රතිකාර කිරීම සඳහා ඇඳන් 150 කින් සමන්විත වාට්ටු 8 ක් ස්ථාපිත කර ඇත.

සෙලාන් බැංකු කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව එහි මූලික අනුග්‍රාහකත්වයෙන් 1 වන ඉංජිනේරු සේවා බලකායේ තාක්ෂණික දැනුම සහ ශ්‍රමදායකත්වය ඇතිව මෙම විශේෂ දැඩිසත්කාර ඒකකයේ ඉදිකිරීම් කටයුතු සිදුකරන ලදී. එමගින් රාජ්‍ය භාණ්ඩාගාරයෙන් වැය කිරීමට සිදුව තිබූ විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි කරගැනීමට හැකියාව ලැබී ඇත.





# පිටකෝට්ටේ පැවති එන්නත්කරණ වැඩසටහන නිරීක්ෂණයට...

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ඉකුත් මැයි 12 වන දින කොළඹ දිස්ත්‍රික්කයේ සිදුකරනු ලබන එන්නත්කරණ වැඩසටහන් පිළිබඳ නිරීක්ෂණය කළේය. ඒ අනුව **පිටකෝට්ටේ** සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල පරිශ්‍රයේ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් පහසුකම් සපයනු ලබන එන්නත්කරණ මධ්‍යස්ථානය ඔහුගේ නිරීක්ෂණයට බඳුන්විය.







# පිටකෝට්ටේ පැවති එන්නත්කරණ වැඩසටහන නිරීක්ෂණයට...

ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ඉකුත් මැයි 12 වන දින කොළඹ දිස්ත්‍රික්කයේ සිදුකරනු ලබන එන්නත්කරණ වැඩසටහන් පිළිබඳ නිරීක්‍ෂණය කළේය. ඒ අනුව **පිටකෝට්ටේ** සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල පරිශ්‍රයේ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් පහසුකම් සපයනු ලබන එන්නත්කරණ මධ්‍යස්ථානය ඔහුගේ නිරීක්‍ෂණයට බඳුන්විය.









# සීදුව අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයට දැඩිසත්කාර ඒකක ඇඳන් 10 ක්...

යුද්ධ හමුදාව විසින් ස්ථාපනය කරන ලද සීදුව අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයට පසුගිය මැයි 17 වන දින අප්ෆීල්ඩ් ශ්‍රී ලංකා පුද්ගලික සමාගමේ (Upfield Sri Lanka Pvt Ltd) කළමනාකාරිත්වය විසින් නව දැඩිසත්කාර ඒකක ඇඳන් 10 ක් පරිත්‍යාග කරන ලදී. ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් **යුද්ධ හමුදා මූලස්ථානයේදී** හමුවූ එම ආයතනයේ මෙරට ප්‍රධානි සහ පාරිභෝගික සංවර්ධන අධ්‍යක්‍ෂ අනුරුද්ධ අලුවිහාරේ මහතා එම ඇඳන් සංකේතාත්මකව යුද්ධ හමුදාධිපති වෙත ප්‍රදානය කරන ලදී.



# යුද්ධ හමුදා රෝහල වෙත සායනික ජල පිරිපහදු [Reverse Osmosis] යන්ත්‍රයක්...

සොෆ්ට්ලොජික් රක්ෂණ සමාගම විසින් කොවිඩ්-19 වසංගතය හමුවේ රෝහල්ගතව සිටින වකුගඩු රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා සායනික ජල පිරිපහදු යන්ත්‍රයක් (Reverse Osmosis) ඉකුත් මැයි 24 වන දින **කොළඹ යුද්ධ හමුදා රෝහලේ** රුධිර කාන්දු පෙරණ ඒකකය වෙත පරිත්‍යාග කරන ලදී.

රුපියල් ලක්‍ෂ පහක පමණ වටිනාකමකින් යුත් මෙම සායනික ජල පිරිපහදු (Reverse Osmosis) යන්ත්‍රය සොෆ්ට්ලොජික් රක්‍ෂණ සමාගමේ සාමාජිකයන් විසින් යුද්ධ හමුදා රෝහලේ දී ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාත්මක මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් වෙත පිළිගන්වනු ලැබිය.

# ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙනුවෙන් පරිත්‍යාගයක්...





කොවිඩ් - 19 පැතිරීම වැළැක්වීම වෙනුවෙන් යුද්ධ හමුදාව විසින් සිදුකරනු ලබන කඩිනම් ක්‍රියාමාර්ග පිළිබඳ අවධානය යොමුකරනු ලැබූ Lanka Nature Power & Rough T-Shirts සමාගමේ විධායක නිලධාරීන් තිදෙනෙකු ඉකුත් මැයි 04 වන දින ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාත්මක මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවූහ. එහිදී ප්‍රතිකාර මධ්‍යස්ථානවල ඇඳ ඇතිරිලි සහ කොට්ට උර මැසීම සඳහා කපු රෙදි යාර 7800 ක් පරිත්‍යාග කරන ලදී.



# මාතෘ හා ළමා ඒකකයේ පහසුකම් පිළිබඳව සාකච්ඡාවක්...

මාතෘ හා ළමා සෞඛ්‍ය පිළිබඳ විශේෂඥයින් වන සෞඛ්‍ය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් වෛද්‍ය එච්.එස්.ආර් පෙරේරා මහත්මිය, පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂ වෛද්‍ය චිත්‍රාමලී ද සිල්වා මහත්මිය, ළමා වෛද්‍ය විශේෂඥයින් වන වෛද්‍ය මහාචාර්ය සමන්ත රජින්ද්‍රජිත් මහතා, වෛද්‍ය සුරන්ත පෙරේරා මහතා සහ ශ්‍රී ලංකා ප්‍රජා සෞඛ්‍ය සංගමයේ සභාපති වෛද්‍ය සනත් ලැන්රෝල් මහතා ඇතුළු පිරිස ඉකුත් මැයි 24 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවිය. එහිදී යුද්ධ හමුදාව විසින් සීදූව ප්‍රදේශයේ ස්ථාපිත කරනු ලැබූ අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයේ වෛරසය ආසාදිත මාතෘ හා ළමා රෝගීන් සඳහා ඇති පහසුකම් පිළිබඳ කරුණු සාකච්ඡා කෙරිණ.





# යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රදර්ශනයට බෞද්ධ ධජයක්...

වෙසක් උත්සවය වෙනුවෙන් යුද්ධ හමුදාවේ ජ්‍යේෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරියෙකු විසින් නිර්මාණය කරන ලද බෞද්ධ කොඩියක් පසුගියදා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් වෙත යුද්ධ හමුදා මූලස්ථානයේදී භාරදෙන ලදී.

වෙසක් සමයේ යුද්ධ හමුදා මූලස්ථාන ප්‍රධාන ගොඩනැගිල්ල අලංකාරවත් කිරීමේ අපේක්ෂාවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ සැරයන් කේ.කේ.එම්. පුෂ්පකුමාර අඩි 100 x 50 ක ප්‍රමාණයෙන් යුතු මෙම විශාල බෞද්ධ ධජය නිර්මාණය කර ඇත.



# අභිමන් ගමනකට උණුසුම් සුභ පැතුම්...

12 වන විජයග්‍රාහී සැමරුමට සමගාමීව මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබූ යුද්ධ හමුදාවේ බ්‍රිගේඩියර් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත නිල ලාංඡන පැළඳවීම ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ සුරතින් ඉකුත් මැයි 20 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදුකෙරිණි.

එහිදී, මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 12 දෙනෙකුට නිල ලාංඡන පැළඳවිය. ඒ අනුව උසස්වීම් ලැබූයේ මේජර් ජෙනරාල් ජීඩී සූරියබණ්ඩාර යූඑස්පී, මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී, මේජර් ජෙනරාල් ඩීපීයූ ගුණසේකර ආර්ඩබ්ලිව්පී යූඑස්පී අයිජී, මේජර් ජෙනරාල් කේආර්කේකේටී බණ්ඩාර ආර්එස්පී යූඑස්පී, මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී, මේජර් ජෙනරාල් ඩබ්ලිව්එච්කේඑස් පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ, මේජර් ජෙනරාල් එල්ඩීඑස්එස් ලියනගේ ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී, මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී යූඑස්පී එන්ඩියූ, මේජර් ජෙනරාල් එම්ජීටීඩී රත්නසේකර යූඑස්පී, මේජර් ජෙනරාල් කේඑච්කේ කෝට්ටවත්ත ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ සහ මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඩබ්ලිව්එම්ආර්එස්පී අලුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යන නිලධාරීහුය.

# බංගලාදේශ මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්‍ෂක උපදේශක හමුවෙයි...



බංගලාදේශ මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්‍ෂක උපදේශක කොමදෝරු මොහොමඩ් ෂෆීල් බාරි *(Shafiul Bari)* ඉකුත් මැයි 05 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවිය.

මෙම සුහද හමුවේදී, ත්‍රිවිධ හමුදා හටපිරිස් වෙනුවෙන් බංගලාදේශ හමුදාව විසින් ලබාදී ඇති පහසුකම් වලට අමතරව පුහුණු ක්‍රමවේද සහ හමුදා සංවිධාන අතර පවත්නා ද්විපාර්ශ්වික සම්බන්ධතා පිළිබඳව වැඩි අවධානයක් යොමු කෙරිණ.





# සීදුව අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානය නිරීක්ෂණය කරමින්...

කොවිඩ්-19 වෛරසය ආසාදනයවී පීඩාවට පත් ශ්‍රී ලාංකිකයින් හට අවැසි පහසුකම් ලබාදීමට හා ඉතා උසස් වූ සෞඛ්‍ය සේවාවක් නොමිලේ ලබාදීම සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ පූර්ණ දායකත්වය යටතේ ඇඳන් 1200 කින් යුත් නවීන පහසුකම්වලින් සමන්විත සීදුව ප්‍රදේශයේ ඉදිකරන ලද මෙරට විශාලතම අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානය (ICC) හි නිරීක්ෂණ චාරිකාවක් සඳහා මෙරට මාතෘ හා ළමා සෞඛ්‍ය පිළිබඳ විශේෂඥ වෛද්‍ය කණ්ඩායමක් ඉකුත් මැයි 25 වන දින සහභාගි වූහ.

මෙම අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයේ නේවාසිකව හා ප්‍රතිකාර පහසුකම් ලබාගැනීමට පැමිණෙන රෝගීන්ගේ සෞඛ්‍ය, සනීපාරක්ෂක, වෛද්‍ය පහසුකම් සුහසාධක පහසුකම් හා පරිපාලන ව්‍යුහය පිළිබඳ **යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ** ගරු සභාපතිනි සුජීවා නෙල්සන් මැතිනිය විසින් නිරීක්ෂණ චාරිකාව අතරතුර විශේෂඥ වෛද්‍ය කණ්ඩායම වෙත කෙටි හැඳින්වීමක් සිදුකරනු ලැබුවාය.

එහිදී නවීන සෞඛ්‍ය පහසුකම්, හදිසි ප්‍රතිකාර ඒකකය (ETU), හුදෙකලා අංශය (Isolation Section), Resuscitation Units, දැඩිසත්කාර ඒකකය (ICU), වෛද්‍ය උපකරණ හා බෙහෙත් ගබඩා පහසුකම් කටයුතු සෞඛ්‍ය විශේෂඥයින් විසින් පැසසුමට භාජනය කරන ලදී.












# සීදුව නිරෝධායන ප්‍රතිකාර මධ්‍යස්ථානයට වටිනා පරිත්‍යාග රැසක්...

යුද්ධ හමුදාව විසින් සීදුව ප්‍රදේශයේ ඉදිකරනු ලබන ලංකාවේ විශාලතම කොවිඩ් - 19 රෝහලට අත්‍යවශ්‍ය ඖෂධ, රූපවාහිනී යන්ත්‍ර, රෙදි සෝදන යන්ත්‍ර, ශීතකරණ, ලිනන් රෙදි ඇතුළු උපකරණ හා ද්‍රව්‍ය තොගයක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් ලබාදෙන ලදී. **යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ** ගරු සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය පසුගිය 09 වන දින මෙම රෝහල වෙත ගොස් එම පරිත්‍යාගයන් ලබාදුන්නාය.

ඇඳන් 1200 කින් සමන්විත මෙම වැඩිදියුණු කළ නවීන අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානය සහ රෝහල සියලුම අත්‍යවශ්‍ය සෞඛ්‍ය පහසුකම් වලින් සමන්විත වන අතර, කොවිඩ් - 19 වෛරසය ආසාදනය වන ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් හොඳම සහ කඩිනම් සෞඛ්‍ය සේවාවක් නොමිලේ ලබාදීම එය ඉදිකිරීමේ අරමුණයි. මෙම අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සඳහා "බ්‍රැන්ඩික්ස්" ආයතනය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත එම ගොඩනැගිල්ල පරිත්‍යාග කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතිය ආරම්භයේ සිටම යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මේ වෙනුවෙන් අත්වැල් බැඳගනිමින් කටයුතු කරන ලදී.



# ඉගෙනුමට අත්වැලක්...

**ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා රෙජිමේන්තුවෙහි** රාජකාරි කරනු ලබන නිලධාරි, සෙසුනිල හා සිවිල් සේවක මහතුන් අතුරින් ආර්ථික අපහසුතාවයන් ඇති විශේෂයෙන්ම දැනට රටෙහි පවතින කොරෝනා වසංගත තත්වය මත සිය අධ්‍යාපන කටයුතු අන්තර්ජාලය ඔස්සේ සිදුකරන දූවා දරුවන්ට අත්වැලක් වීම පිණිස ඔවුනට ටැබ් පරිගණක යන්ත්‍ර 127 ක් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් පසුගිය මාර්තු 13 වන දින **පනාගොඩ යුද්ධ හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු මධ්‍යස්ථානයේ** දී පැවැත්විණි.



ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මෙන්ම ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් කේඑන්එස් කොටුවේගොඩ එන්ඩීසී අයිජී ගේ හා ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි ශ්‍යාමිණී කොටුවේගොඩ මහත්මියගේ අධීක්ෂණය, මගපෙන්වීම මත සිදුකෙරුණු මෙම අධ්‍යාපනික සත්කාරයට ප්‍රධාන ආරාධිත අමුත්තිය වශයෙන් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය සහභාගී වූවාය. අදාළ පරිත්‍යාග ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවේ හිටපු සභාපතිනිය වන තනුජා ඩයස් මහත්මියගේ මූලිකත්වයෙන් සහ සෙසු පරිත්‍යාගශීලීන්ගේ දායකත්වය මත සිදුකෙරිණි.
එම අවස්ථාවට සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්, බටහිර ආරක්ෂක සේනා ආඥාපති ඇතුළු පිරිසක් සහභාගී වූහ.



# යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාව...



ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය ගේ උපදෙස් පරිදි **3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය** වෙතින් සංවිධානය කරනු ලැබූ වෛද්‍ය වැඩමුළුවක් පසුගිය මාර්තු 20 වන දින පවත්වන ලදී. තවද එම වැඩසටහනට සමගාමීව වෛද්‍ය නිශා ප්‍රසාදි ප්‍රනාන්දු විසින් "මිතුරු පියස" වැඩසටහන පිළිබඳ දේශණයක්ද සිදුකරන ලදී.





# වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාව...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි විශේෂඥ වෛද්‍ය නිල්මිණී ප්‍රනාන්දු මහත්මියගේ ප්‍රධානත්වයෙන් **කොළඹ යුද්ධ හමුදා රෝහල්** ශ්‍රවණාගාරයේදී ඉකුත් අප්‍රේල් 08 වන දින ලේ දන්දීමේ කඳවුරක් පවත්වන ලදී. මේ සඳහා නිලධාරීන් හා සෙසුනිලයින් 300 ක පමණ පිරිසක් සහභාගී වූහ.









# වෘත්තීය නිලධාරීන් පිරිසක් විසිරයති...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවට ඉදුරාම බඳවාගත් වෘත්තීය නිලධාරීන් 10 දෙනෙකු මූලික වෘත්තීය නිලධාරී පාඨමාලා අංක -10 සාර්ථකව අවසන් කර ඉකුත් මැයි 13 වන දින **දියතලාවේ පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා පුහුණු පාසලේදී** විසිර ගියහ.

තොරතුරු තාක්ෂණ, වෛද්‍ය විද්‍යාව සහ ගණකාධිකරණය පිළිබඳ සුදුසුකම් සපුරා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවට වෘත්තීය නිලධාරීන් ලෙස ඉදුරාම බඳවාගත් එම නිලධාරීන්ගේ මූලික පුහුණුවෙන් අනතුරුව පැවති විසිරයාමේ උත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක සහ ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් කේඑන්එස් කොටුවේගොඩ එන්ඩීසී අයිජී සහභාගි විය.

මෙම අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක ඇතුළු මාණ්ඩලික නිලධාරීන් රැසක්ද එක්වූහ.



# අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික ගේ සංචාරයන්...

යුද්ධ හමුදා මූලස්ථානයේ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් ඒඑ‍ීඅයි ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී යූඑස්පී පසුගිය මැයි 06 සහ 08 යන දෙදින තුළ **ආරක්‍ෂක සේනා මූලස්ථානය (වන්නි) සහ ආරක්‍ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය)** හි සංචාරයක නිරත විය.

එකී සංචාරයන්හිදී එම මූලස්ථානයන්හි වර්තමාන තත්වය, ඉදිකිරීම් හා සමාජ සුභසාධන ව්‍යාපෘති සඳහා යුද්ධ හමුදාවේ මැදිහත්වීම පිළිබඳ සාකච්ඡා කෙරිණි. තවද ආරක්‍ෂක සේනා මූලස්ථානය (වන්නි) බලප්‍රදේශයේ ස්ථාපිත පතොරම් වෙඩි ද්‍රව්‍ය ගබඩාවද ඔහුගේ නිරීක්‍ෂණයට බඳුන්විය.

මෙම අවස්ථාවට වන්නි ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහ කිලිනොච්චි ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ද එක්වූහ.



අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික වන්නි බලප්‍රදේශයේ සංචාරය කළ අවස්ථාව.



අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික කිලිනොච්චි බලප්‍රදේශයේ සංචාරය කළ අවස්ථාව.






# ආඥාපතිගේ ඉනපෙ (උතුර) සංචාරය...




**ආරක්ෂක සේනා යාපනය** ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් මැයි 01 වන දින ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) සහ ඒ යටතේ ස්ථාපිත ඒකකවල සංචාරයක නිරතවිය. එහිදී ඔහු ප්‍රදේශයේ රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් ඇමතීමටද කටයුතු කළේය.

තවද ආඥාපති 4 වන ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේද සංචාරය කළ අතර, එහිදී දැනට අළුත්වැඩියා කටයුතු සඳහා යොමුකර ඇති වාහන සහ සෙසුනිලයින් සඳහා ආහාර ප්‍රවාහනය වෙනුවෙන් වැඩිදියුණු කරන ලද පාපැදි අළුත්වැඩියා කටයුතු පිළිබඳ ප්‍රගතියද නිරීක්ෂණය කරන ලදී.









## වන්නි වෙසක් අසිරිය සමරයි...

ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පීගේ මඟපෙන්වීම යටතේ එම හමුදා මූලස්ථානයේ ඉකුත් මැයි 26 වන දින වෙසක් උත්සවය සැමරූහ. එහිදී භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් දානය පූජා කිරීම ඇටඹගස්කඩ ශ්‍රී සුදර්ශනාරාමය, මඩුකන්ද ශ්‍රී දළදා විහාරය සහ ශ්‍රී බෝධි දක්ෂිනාරාමය වව්නියාව යන ස්ථානයන්හිදී පැවැත්විණි. තවද එම මූලස්ථාන බෝධි මළුවේදී බෝධි පූජා පිංකමක් ද පැවැත්වූ අතර, වන්නි කඳවුරු පරිශ්‍රය සහ කඳවුරේ මාර්ගයේ දෙපස වර්ණවත් ලෙස වෙසක් පහන් වලින් ද සරසා තිබුණි.

## කනගරායන්කුලම් පොලිස් මාර්ග බාධකයට පහසුකම් සලසයි...



**කනගරායන්කුලම්** A9 මාර්ගයේ පුත්තූර් යුද හමුදා පොලිස් හා පොලිස් මාර්ග බාධකයේ රාජකාරි නියුතු හමුදා භටයින්ගේ ආරක්‍ෂාව මෙන්ම නවාතැන් පහසුකම් වැඩිදියුණු කිරීමෙන් පසු එහි රාජකාරීන් අධීක්‍ෂණය කිරීම සඳහා **වන්නි ආරක්‍ෂක සේනා** ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පසුගිය මැයි 18 වන දින සංචාරයක නිරත විය. ආරක්‍ෂක සේනා මූලස්ථානය (වන්නි) බලප්‍රදේශයේ ස්ථාපිත 16 ශ්‍රී ලංසිරෙ හමුදා සෙබළුන් විසින් එය පවත්වාගෙන යනු ලබයි.





# හොරොච්චෝලේ කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයේ පහසුකම් පිළිබඳ සොයාබලයි...

කොරෝනා වෛරසයේ තෙවන රැල්ල ප්‍රබල ලෙස පැතිරයාම නිසාවෙන් **නැගෙනහිර** ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පසුගිය මැයි මස 04 වන දින අම්පාර ප්‍රදේශයේ පිහිටි 24 වන සේනාංක මූලස්ථානයේ සහ **නොරොච්චෝලේ** පිහිටි නිරෝධායන මධ්‍යස්ථාන වෙත ගොස් ප්‍රදේශයේ වත්මන් තත්වය පිළිබඳ අවබෝධයක් ලබාගත්තේය. ඊට අමතරව, හදිසි අවස්ථාවකදී ආශ්‍රිතයින් වැඩි ප්‍රමාණයක් නිරෝධායනය කිරීමේ පහසුකම් සැපයීමට ඇති හැකියාව පිළිබඳව ද සොයාබැලූ හෙතෙම අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය එස්.පී.ඒ. පී සේරසිංහ සහ කල්මුනේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හා වෛද්‍ය ජී. සකුනාන් සමඟ නිරෝධායන කටයුතුවල නිසි ක්‍රියාකාරිත්වය සහ ප්‍රදේශය තුළ වෛරසය පැතිරීම අවම කරගැනීමේ හැකියාව පිළිබඳව ද සාකච්ඡා කරනු ලැබූහ.



# භාරතීපුරම් හි පිහිටි කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයේ වැඩිදියුණු කිරීම් පිළිබඳ සොයා බලමින්...

කොවිඩ් - 19 වෛරසයේ තෙවන රැල්ලේ ආසාදිතයින් හට ප්‍රතිකාර කිරීමේ අරමුණින් **ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය)** බලප්‍රදේශයේ **භාරතිපුරම්** ප්‍රදේශයේ අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලද අතර, එය හදිසි වෛද්‍ය පහසුකම් හා වෛද්‍ය වෘත්තිකයින් කණ්ඩායමකින් සමන්විතය.

අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා අවැසි උපදෙස් සහ ලබාදිය හැකි දායකත්වය පිළිබඳ සාකච්ඡාවක් කිලිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී විසින් පසුගිය මැයි 06 වන දින සිදුකරන ලදී. එම අවස්ථාව සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, කිලිනොච්චිය දිස්ත්‍රික් රෝහල් අධ්‍යක්ෂ, 57 වන සේනාංකයේ සේනාංකාධිපති, 571 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.








# වේනාවිල් සහ මාන්චෝලේ දිසා රෝහල්හි කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන පිහිටුවයි...

මුලතිව් ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ආර්පීඩියු රාජපක්‍ෂ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ උපදෙස් හා මගපෙන්වීම මත නිරෝධායන මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මක **වේනාවිල්** කඳවුර සහ **මාන්චෝලේ** දිසා රෝහල කොවිඩ්-19 වෛරස් ආසාදිතයින් සඳහා ප්‍රතිකාර කිරීමේ මධ්‍යස්ථාන ලෙස නවීකරණය කිරීමේ කටයුතු සිදුකරනු ලබයි.

එම කටයුතු අධීක්‍ෂණය කිරීම සඳහා මුලතිව් ආරක්‍ෂක සේනා ආඥාපති, 68 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, එම සේනාංකයේ නිලධාරීන් සහ 18 විපාරෙ අණදෙන නිලධාරී ඇතුළු පිරිසක් සහභාගී වූහ.







# කොවිඩ් මර්දනය සබැඳි සාකච්ඡාවක්...

**ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර)** ආඥාපති මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් කොවිඩ් - 19 වෛරසය ව්‍යාප්තිය මර්දනය කිරීම සබැඳි සාකච්ඡාවක් ඉකුත් මැයි 14 සහ 20 යන දෙදින තුළ එම ආසේමු සාකච්ඡා ශාලාවේදී පවත්වන ලදී. එහිදී, අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන සහ නිරෝධායන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම, නිකුත් කර ඇති සෞඛ්‍ය ආරක්ෂක ක්‍රමවේද අනුගමනය කිරීමේ ඇති වැදගත්කම සහ ඒ පිළිබඳව රාජකාරි කරනු ලබන නිලධාරී/සෙසුනිලයින් අඛණ්ඩව දැනුවත් කිරීම යන කරුණු සාකච්ඡා කෙරිණි.

මේ සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) බලප්‍රදේශයට අයත් බලසේනාවල බලසේනාධිපතිවරු, යුද්ධ හමුදා ජනපදය පනාගොඩ ස්ථාපිත අධ්‍යක්ෂ මණ්ඩලවල අධ්‍යක්ෂකවරු, එහි ස්ථාපිත රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායකවරු හා යුද්ධ හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසලේ සේනාවිධායක ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# පිළිසකර කිරීමේ කටයුතු නිරීක්ෂණය කරමින්





පසුගිය දිනවල පැවති අධික වර්ෂාපතනයත් සමඟ **හංවැල්ල** නගරයට ආසන්න පොල්අත්තාව යන ස්ථානයේ ගං ඉවුර ඛාදනයට ලක්වීම හේතුවෙන් එය කඩිනමින් පිළිසකර කිරීමේ අවශ්‍යතාවය මතුවිය. ඒ අනුව **ආරක්ෂක සේනා (බටහිර)** ආඥාපති මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උපදෙස් පරිදි 14 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ සහ 142 වන පාබල බලසේනාධිපතිගේ අධීක්ෂණය යටතේ 10 ශ්‍රීලංජාආබමු භටපිරිස්වල ශ්‍රමදායකත්වයෙන් එම කාර්යය සිදුකරනු ලැබූහ.





# කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් නුවරඑළියේ...



කොවිඩ්-19 වෛරසය ආසාදිත රෝගීන් 275 දෙනෙකුට නවාතැන් ගතහැකි පරිදි **නුවරඑළිය කොටගල** තොන්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානය අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කිරීමට 3 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ හටපිරිස් කටයුතු කළහ. සෞඛ්‍ය නිලධාරීන්ගේ සහයෝගය ද ඇතිව දින 05 ක් වැනි අඩු කාලසීමාවකදී අළුත්වැඩියා කරන ලද එම මධ්‍යස්ථානයට ඇඳන්, මෙට්ට සහ කොට්ට ඇතුළු අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සපයා තිබීම ද විශේෂත්වයකි.

මධ්‍යම ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එන්ආර් ලමාහේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සම්බන්ධීකරණයෙන් 11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ සහ 112 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ අධීක්‍ෂණය මත එම කටයුත්ත සිදුවිය.

# දියතලාව යුධ රෝහලට නව නිලධාරී නිවස්නයක්...

**ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම)** බලප්‍රදේශයේ පිහිටා ඇති යුද්ධ හමුදා රෝහල - දියතලාවෙහි ඉදිකිරීමට යෝජිත නව නිලධාරී නිවස්නය සඳහා මුල්ගල තැබීමේ කටයුතු ඉකුත් මැයි 05 වන දින සිදුකරන ලදී. ඒ අනුව එදින ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එන්ආර් ලමාහේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් ඉදිකිරීමට යෝජිත නව නිලධාරී නිවස්නය සඳහා මුල්ගල තබන ලදී. මෙම අවස්ථාව සඳහා ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගි වූහ.



# සෙබළ යුග දිවි පදනම





සෙබළ ස්වභාවය සාමාන්‍ය මිනිස් චින්තනයෙන් ඔබ්බෙහි පවතින්නා වූ චෛතසික රටාවන්ගෙන් සැදුම්ලත් බැවි පසක් වූ පිළිගැනීමට අකමැති වූ විද්වත් කරුණකි. එය හුදෙක් අධ්‍යාපනික මට්ටම නමැති මිනුම් දණ්ඩට යට වූ සුවිශේෂී මානසික රාමුවක්ම වේ.

එවන් අභීත හදවතක් අපේක්ෂා කරන්නා වූ දයාබරත්වය හා යුග දිවිය කෙතරම් සුවිශේෂී විය යුතුද? තවද, මෙම අපේක්ෂණය යථාර්ථයක් බවට පත් වීම උදෙසා එවන් උතුම් අයෙකු හට දිය හැකි මාර්ගෝපදේශනයන් කෙබඳු විය යුතු දැයි විවරණයන්, විචාරණයන් කෙතරම් අත්‍යවශ්‍ය වේද යන්න කාලෝචිත විෂය පථයන් වේ.

සංක්ෂිප්තනයේදී උක්ත කරුණු පරාසය පහත අනු සාධකයන් අනුව විශ්ලේෂණය කිරීම යෝග්‍ය බැවි පෙන්වා දීමට අපේක්ෂා කරමි. පහත සාධකයන් අනුව සිත යොමු කර සිය ජීවන සහකාරීත්වය යමෙකු වෙත පිදීම යුග දිවි සාර්ථකත්වය උදෙසා ඔබට සහය වනු ඇත.

### ★ අධ්‍යාත්මික හඳුනා ගැනීම හා හේතු මූලය අවබෝධනය

බාහිර ස්වභාවය හා පසිඳුරන්ට ගෝචර වූ සංවේදයන්ම අනුව පමණක් නොසිතීමෙන් තම සහකරු හෝ සහකාරිය පිළිබඳව අව්‍යාජව හටගත් චෛතසිකය විමසීමද අත්‍යවශ්‍ය කරුණකි. ලෞකික දියුණුවට ඉනිමඟක් ලෙස සැලකීම හා වියැකෙන අස්ථිර දෑ කෙරෙහි පමණක් ලොබ බැඳීම නොකළ යුතුය.

යම් හෙයකින් ඔබ අධ්‍යාත්මිකව සංතෘෂ්ටිමත් වන්නෙහි නම් එහිදී ද එම හේතුවේ හේතු මූලය සෙවීම අත්‍යවශ්‍ය කරුණකි. ඔබට එය අපැහැදිලි වුවද එම සංසිද්ධිය ඉතා ධනාත්මකව දිවිය නිරන්තරයෙන් ප්‍රකෘතිමත් බවට පත්කරනු ඇත.

### ★ විශ්වාසය ජීවන පදනම සේ

සෑම විටම ශක්තිමත් පදනම චිරජීවනයෙහි මූල සාධකයයි. මෙම න්‍යායාත්මක අදහස ප්‍රායෝගික විශ්වාසය නම් භූමිකාව ඔස්සේ සෙබළ යුගදිවියට ළඟාකර ගැන්ම අනිවාර්ය අවශ්‍යතාවයකි. දුරස්ථව දිවි ගෙවීම හා ජීවන සමබරතාවය හුදෙක් සැබෑ විශ්වාසය මත පමණක්ම පවතී. එවන් ස්ථිරසාර විශ්වාසනීයත්වයක් අන්‍යෝන්‍ය වශයෙන් ගොඩනගා ගැන්ම ඉතා තීරණාත්මක සාධකයකි. ඔබ රැක ගත යුත්තේ විශ්වාසනීයත්වයම බැවි අවිවාදාත්මකය.

### ★ අන්‍යෝන්‍ය ගරුත්වය

ඔබ සෑම විටම ගරුත්වය සිය සහකාරිය/ සහකරුගෙන් ඉමහත්ව බලාපොරොත්තු වනවා වෙනුවට එම අපේක්ෂිත ගරුත්වය පිරිනැමීමට වගවන්න. එවිට සැබෑ අව්‍යාජ ගෞරවාන්විත දිවි පෙවතකට හිමිකාරීත්වය උරුමවීම නිසැකයකි. ගෞරව කිරීම යන්න අවනත වීම යන්න හා පැටලිලි සහිතව නොසිතන්න. සැබැවින්ම එය විග්‍රහයට අපහසු සංවේදයක්ම බැවි වටහා ගන්න.

### ★ නිවැරදි සන්නිවේදනය

අදහස් විවෘත හා නිවැරදි ලෙස අන්‍යෝන්‍ය වශයෙන් සන්නිවේදනය විය යුතුය. සෑම විටම නිවැරදි පණිවුඩය/ අදහස අනෙක් පාර්ශවය විසින් ලබා ගත්තෙහිදැයි තිර කර ගත යුතුය. අවංක බව අත්‍යවශ්‍ය වන ඉතා වැදගත් ක්‍රියාවකි. සෙබළ ප්‍රජාව හා සිය සහකාරී/සහකරුවන් සමග නිරන්තර දුරස්ථ සන්නිවේදනයෙහි නිරත වන අතර එහිදී අපැහැදිලි භාවයන් ඉදිරියේ සෙනෙහෙවන්ත ඉවසීම ගැටුම් අවම කරලීම උදෙසා ඉමහත්ව වැදගත් වේ.

### ★ ඒකායන අරමුණු තෝරා ගැනීම හා ඒකාග්‍රතාවය

අරමුණු හා අභිප්‍රායන් යනු නොසන්සිඳෙන්නා වූ ධාරාවකි. නමුදු සිය යුග දිවිය තුළ සාක්ශාත්කරනය උදෙසා අපේක්ෂිත අරමුණු හා අභිප්‍රායන් අඹුසැමියන් විසින් ඉතා තාර්කික මෙන්ම සංවේදීව තෝරා බේරා ගත යුතුය. එවැනි අරමුණු ඒකායන අරමුණු බවට පත්කර ගැනීමෙහි දක්ෂකම ඉහත සියලු සාධකයන්ගේ නිපුනත්වය මතද අපේක්ෂාව මතද තීරණය වේ. ඉන් නිරන්තර වශයෙන් ඒකාග්‍රතාවය නමැති සාමකාමී අවස්ථාව දිවියේ හිමි කර ගැන්මේ භාග්‍ය හිමි වේ.

### ★ අවසන

ඉහත ගෙනහැර දැක්වූ කරුනු වලට අමතරව තව නවත් කරුනු ඉදිරිපත් කළ හැකිමුත් මතක තබා ගැන්මට ප්‍රමුඛ යැයි සිතූ කරුණු කිහිපයක් ඔබට තිළිණ කළෙමි. සෙබළ මනසෙහි තීව්‍ර බව හා සංකීර්ණත්වය තුළ නිවැරදි යුග දිවියක් හිමි කර ගැන්මෙහි සිය වගකීම දූත ක්‍රියා කිරීම තම වගකීම බැවි පසක් කොට දකිනු.

සටහන
සොහ පන ඇසුරින්..

# දිළිඳු පවුලක නිවාස සිහිනය සැබෑ කරයි...







**56 වන පාබල සේනාංක** බලප්‍රදේශයේ **මුන්ඩිමුරුප්පු** පදිංචි දීපිකා සංජීවනී යන අය වෙනුවෙන් ඉදිකිරීමට යෝජිත නිවසක් සඳහා එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඑච්එන්එස්පී දුණුවිල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් පසුගිය අප්‍රේල් 30 වන දින මුල්ගල තබන ලදී.

එම අවස්ථාව සඳහා 562 බලසේනාධිපති, සහකාර කළමණාකරු මහජන බැංකුව වව්නියාව, 17 (සෙව) ශ්‍රීලංසිරෙ අණදෙන නිලධාරී ඇතුළු නිලධාරී හා සෙසුනිලයින් පිරිසක් එක්වූහ. 17 (සෙව) ශ්‍රීලංසිරෙ භටපිරිස්වල ශ්‍රමදායකත්වය මත අදාළ ඉදිකිරීම් සිදුකරනු ලැබේ.

# වන්නි භටපිරිස් එන්නත්කරණය අරඹමින්...





කොවිඩ් - 19 වෛසරය සඳහා ලබාදෙනු ලබන සයිනොෆාම් එන්නත පසුගිය මැයි 17 වන දින ආරක්‍ෂක සේනා මූලස්ථානය **(වන්නි) බලප්‍රදේශයේ** යුද හමුදා රෝහල (අනුරාධපුරය), ක්ෂේත්‍ර රෝහල (වන්නි) හා 54 වන පාබල සේනාංක මූලස්ථාන වෛද්‍ය මධ්‍යස්ථානය යන ස්ථානයන්හිදී වන්නි ආරක්‍ෂක සේනා බලප්‍රදේශයේ රාජකාරී කරනු ලබන නිලධාරීන් හා සෙසුනිලයින් 300 දෙනෙකු සඳහා ලබාදෙන ලදී.



# යුද්ධ හමුදාවෙන් හිසට සෙවණක්...

**බක්මීගම, තුසිතපුර ප්‍රදේශයේ** වෙසෙන අවශ්‍යතා සහිත පවුලක් වෙනුවෙන් නව නිවසක් ඉදිකරදීම සඳහා මුල්ගල් තැබීම පසුගිය අප්‍රේල් 22 වන දින පැවති කෙටි උත්සවයකින් සිදුකරන ලදී.



මෙම ව්‍යාපෘතිය **22 වන සේනාංකයේ** සේනාංකාධිපති ගේ උපදෙස් සහ 221 වන බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්පී කාරියවසම් ගේ අධීක්ෂණය යටතේ 6 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ භටපිරිස් විසින් දියත් කළහ. මෙම ව්‍යාපෘතිය සඳහා ඕස්ට්‍රේලියාවේ වෙසෙන දානපති නිහාල් සූරියගේ, දමිත් කහවේ සහ සමන් මාරසිංහ යන මහත්වරු මූල්‍ය අනුග්‍රහය ලබා දෙන අතර යුද්ධ හමුදා භටපිරිස් සිය ශ්‍රම දායකත්වය සපයමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබති.

# "දෙමළ මහා සෑය" ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරයි...



**පොලොන්නරුව** ගල් විහාරය සහ තිවන්ක පිළිමගෙය අතර පිහිටා ඇති "දෙමළ මහා සෑය" ක්‍රිස්තු පූර්ව 12 වන සියවසයේදී මහා පරාක්‍රමබාහු රජතුමන් විසින් ඉදිකරනු ලැබූ ස්ථූපයක් වේ. එම ස්ථූපය මැයි මස 01 දින **ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර)** භටපිරිස්වල සහයෝගය ඇතිව ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කළහ.

මෙම ව්‍යාපෘතිය නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපතිගේ සහ නැගෙනහිර ඉදිරි නඩත්තු පෙදෙස ආඥාපති බ්‍රිගේඩියර් ටීඑම් අබේරත්න ආර්එස්පී එල්එස්සී ගේ උපදෙස් මත එම ඉදිරි නඩත්තු පෙදෙසේ මාණ්ඩලික නිලධාරි 1 (පාලන) ලුතිනන් කර්නල් නන්දතිලක ගේ අධීක්ෂණය යටතේ සිදුකෙරිණි.

# තරුණ ජවය නිසි මඟ ගෙනියන
# "ශ්‍රී ලංකා යුද්ධ හමුදාව"

දරුවෝ කියන්නේ රටේ ජීවනාලිය. ඒ වගේම තමයි තරුණයින් කියන්නේ රටේ කොඳු නාරටිය. අපි නිතරම කතාකරන්නේ රටේ දරුවන්ට හොඳම දේ ලබා දීම වෙනුවෙනුයි. හැබැයි රටේ තරුණයා යම් අවස්ථාවකදී අපි හැමෝටම සුළු සුළු වශයෙන් මගහැරුණා. මේ මගහැරීම්වල ප්‍රතිඵලයක් විදිහට එක එක කාලවලදී විවිධ කලකෝලාහල පවා ඇතිවුණා. අපි රටේ දරුවන්ට හොඳම දේ හැම වෙලාවෙදීම ලබා දෙනවා වගේම රටේ තරුණයාත් ඒ විදිහටම රැක බලා ගන්නවා නම් ඒක රටට සිදුකරන ලොකු මෙහෙවරක්. අපි කවුරු කොහොම කිව්වත් රටේ වැඩිහිටි පරම්පරාවේ සැම දෙනාටම රටේ තරුණයා ගැන ලොකු වගකීමක් තියෙනවා. ඒ වගකීම රාජ්‍ය වගේම පුද්ගලික ආයතන විවිධ මට්ටම්වලින් දරමින් ඉන්නවා. මේ වගකීම ගත්තු රජයේ පාර්ශ්වයේ සුවිශේෂීම ආයතනයක් තමයි ශ්‍රී ලංකා යුද්ධ හමුදාව. මේ වෙද්දි රටේ රැකියා නියුක්තිකයින්ගෙන් ලක්ෂ දෙකකට ආසන්න පිරිසක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අයත්. හැබැයි ලංකාවේ අනිත් රැකියා නියුක්තිකයින් එක්ක සංසන්දනය කරලා බලද්දි යුද්ධ හමුදාවේ සේවයේ නිරත වෙලා ඉන්න පිරිස සුවිශේෂීයි. මොකද රටේ ඉන්න පුහුණුව ලත්, විනයගරුක, විශාලතම ශ්‍රම බලකාය තමයි ශ්‍රී ලංකා යුද්ධ හමුදාව.

ගංවතුරකදි, නායයාමකදි, එහෙමත් නැත්නම් මොකක්ම හරි ආපදාවකදි යුද්ධ හමුදාව පෙරට එන්නෙ ඒ ඔවුන් සතු පුහුණුව සහ විනය නිසයි. හොඳම උදාහරණය කොවිඩ්. නිරෝධායන මධ්‍යස්ථාන හදන තැන ඉඳන්ම කොවිඩ් පැතිරීම පාලනය කරන්න ගත්ත හැම ක්‍රියාමාර්ගයකදීම පෙරමුණ ගත්තේ යුද්ධ හමුදාව. ඒ විතරක් නෙවෙයි මේ වෙනකොට ජාතිය ගොඩනැගීමේ ව්‍යාපෘති රැසක්ම ක්‍රියාත්මක කරන්නේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව. දැන් බලන්න ගම් සමග පිළිසඳර වැඩසටහනේදි ජනාධිපතිතුමා යුද්ධ හමුදාවට කොයිතරම් ව්‍යාපෘති භාර දෙනවාද? කොළඹ තුරග තරග පිටිය, ආකේඩ් ඉන්ඩිපෙන්ඩන්ට් පරිශ්‍රය, දියත උයන, නෙළුම් පොකුණ, නෙළුම් කුළුණ ආදී ඉදිකිරීම් රැසකට ශ්‍රම දායකත්වය ලබාදෙන්නට තරම් නිපුණත්වයකින් පිරි ශ්‍රම බලකායක් යුද්ධ හමුදාව සතුයි. මේ පුහුණු විනය ගරුක ශ්‍රම බලකාය නිර්මාණය කිරීම පහසු වැඩක් නම් නොවේ.

දිවයින පුරා විසිරුණ යුද්ධ හමුදා කඳවුරු වලට සම්මුඛ සාකච්ඡාවලට පැමිණෙන තරුණ තරුණියන් මූලික පරීක්ෂණ වලින් පස්සේ තෝරාගෙන ඒ ඒ පුහුණු මධ්‍යස්ථානවල ධාරිතාවය අනුව වෙන්කරනවා. එහෙම වෙන් කරන තරුණ තරුණියෝ තමා මේ පුහුණු පාසල්වලට එන්නේ. මේ අය විවිධ අධ්‍යාපනික මට්ටම්වල අය. මොකද යුද්ධ හමුදාවට සාමාන්‍ය සෙබළුන් බඳවා ගැනීමේ අවම අධ්‍යාපන සුදුසුකම වෙන්නේ අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම විතරයි. මේ විදිහෙ විවිධ සමාජ මට්ටම්වල, විවිධ



අධ්‍යාපන මට්ටම්වල, විවිධ ජාති ආගම්වල පිරිස් එක ඉලක්කයකට යොමු කරන එකත් එක්තරා යුද්ධයක් තමා ඉතින්. යුද්ධ හමුදාවට අලුතින් බඳවාගන්න තරුණ පිරිස් පුහුණු කරන පුහුණු පාසල් අතරින් පුත්තලම ආධුනික පුහුණු පාසලේදී මේ ආධුනික පුහුණුව සිද්ධ වෙන්නේ කොහොමද කියලා බලාගන්න අවස්ථාවක් අපිට ලැබුණා.

මේ අයගේ සියලු වැඩසටහන් සිද්ධ වෙන්නේ කාලසටහනට අනුව. ඒ කාලසටහනේ විදිහට නම් දවසේ වැඩ පටන් ගන්න තියෙන්නේ උදේ හයයි කාලට. සාමාන්‍යයෙන් ශාරීරික අභ්‍යාස, ලොග් ව්‍යායාම (දැව කඳන් යොදාගනිමින් සිදුකරන ව්‍යායාම), ටී 56 අවි ප්‍රායෝගික පරීක්ෂණ, ගිනි අවි සමඟ කරන ව්‍යායාම වගේම යුද බාධක තරණය කිරීමත් උදේම මේ අයට කරන්න වෙනවා. ඊට පස්සේ තමයි උදේ ආහාරය ලබා ගන්නේ. ඊට පස්සේ දවස පුරා පරීක්ෂණ පෙළපාලි, මුර ආරෝහණය සහ අවරෝහණය, ආවරණ භාවිතය, මාර්ග සරඹ, ගමනේදී අවි සරඹ, අවිය සහිතව සහ රහිතව යුද බිමේ ගමන් කිරීම වගේ විශාල වපසරියක පැතිරුණු විෂය නිර්දේශයක් යටතේ න්‍යායාත්මක වගේම ප්‍රායෝගික පුහුණුව නොඅඩුව හිමිවෙනවා.

ඒ විතරක් නෙවෙයි මේ අයට සමාජමය දැනුම ලබාදෙමින් නවීන ලෝකය සමඟ යාවත්කාලීන කරන වැඩපිළිවෙලක් මේ වෙනකොට ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මේ පිළිබඳ සුවිශේෂී අවධානයක් යොමු කරන්න කියලා පුහුණු පාසල් සේනාවිධායකවරුන්ට දැනුම් දීලා තියෙනවා. මොකද යුද්ධයක් ක්‍රියාත්මක නොවෙන අවස්ථාවක යුද්ධ හමුදාවට තමන්ගේ ප්‍රාථමික රාජකාරී අතරතුර ද්විතීය රාජකාරිවලත් නිරත වෙන්න තියෙන නිසා යුද්ධ හමුදාවට ආධුනික සොල්දාදුවන් විදිහට එකතුවෙන සියලුම දෙනා සමාජීය දැනුමෙන් සහ තාක්ෂණික දැනුමෙන් යාවත්කාලීන කිරීම ඇඩි අවශ්‍යතාවයක් කියන දේ යුද්ධ හමුදාධිපතිතුමන් ප්‍රකාශ කරලා තියෙනවා. වර්තමාන යුද්ධ හමුදාධිපතිතුමා මේ ආධුනික පුහුණු මධ්‍යස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනයට, පුහුණු ආධාර ඉහළ නැංවීමට වගේම උපදේශකයින්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම ගැනත් සුවිශේෂී අවධානයක් යොමු කරලා

> **"මේ වෙද්දි රටට බලපාලා තියෙන කොවිඩ් උවදුර නිසා විශාල තරුණ පිරිසකට තමන් කරපු රැකියාව අහිමි වෙලා තියෙනවා. ඒ විදිහට රැකියාව අහිමිවුණු විශාල පිරිසක් මේ වෙනකොට යුද්ධ හමුදාවට බැඳිලා තියෙනවා ආධුනිකයින් විදිහට. ඔවුන් කියන්නේ තමන් මීට කලින් රැකියා කළත් මීට වඩා වේතනයක් ලබා ගත්තත් යුද්ධ හමුදාවේ පුහුණුව ඒ හැමදේටම වඩා වැදගත් කියලයි."**

කටයුතු කරන නිසා පුහුණුවෙන් පස්සේ විසිර යන ආධුනික සොල්දාදුවා ඉතා ඉහළ දැනුමක් සහ ගුණාත්මකභාවයක් සහිත අයෙක් බවට නිරායාසයෙන්ම පත්වෙනවා. ආධුනික සෙබලෙක් මාස හයක මූලික පුහුණුව ලබාදීලා විසිරයාම දක්වා යුද්ධ හමුදාවෙන් විශාල මුදලක් වියදම් කරනවා. ඒ විදිහට වියදම් කරන්නේ උසස් වෘත්තීමයභාවයකින් යුතු සොල්දාදුවෙක් නිර්මාණය කිරීම වෙනුවෙන්මයි.

මේ වෙද්දි රටට බලපාලා තියෙන කොවිඩ් උවදුර නිසා විශාල තරුණ පිරිසකට තමන් කරපු රැකියාව අහිමි වෙලා තියෙනවා. ඒ විදිහට රැකියාව අහිමිවුණු විශාල පිරිසක් මේ වෙනකොට යුද්ධ හමුදාවට බැඳිලා තියෙනවා ආධුනිකයින් විදිහට. ඒ පිරිස අතර ප්‍රසිද්ධ හෝටල්වල සේවය කළ සූපවේදීන්, විවිධ ආයතනවල පරිගණක ක්‍රියාකරුවන් ඇතුළු වෘත්තිකයින් විශාල පිරිසක් ඉන්නවා. ඔවුන් කියන්නේ තමන් මීට කලින් රැකියා කළත් මීට වඩා වේතනයක් ලබා ගත්තත් යුද්ධ හමුදාවේ පුහුණුව ඒ හැමදේටම වඩා වැදගත් කියලයි. මොකද තමන්ට තිබුණු නිදහස මේ පුහුණුව නිසා සීමා වුනත් ලැබෙන වෘත්තීයමය භාවය ඊට වඩා වැදගත් කියලා ඔවුන්ට මේ පුහුණුව නිසා දැනෙනවා කියන දේ තමයි ඔවුන් අපි සමඟ කිව්වේ.

මේ විදිහට පුහුණුවෙලා යුද්ධ හමුදා සක්‍රිය සේවයට එක්වෙන ආධුනික සෙබළෙකුට ඉන්දියාව, පකිස්ථානය සහ බංගලාදේශයේ පැවැත්වෙන කණිෂ්ඨ නායකත්ව පාඨමාලාවට, ඉන්දියාවේ පැවැත්වෙන ප්‍රති ත්‍රස්තවාදී ක්‍රම පාඨමාලාව/ පැරෂුට් පාඨමාලාව/ ක්ෂේත්‍ර බුද්ධි පාඨමාලාව/ සංඥා ක්‍රියාකරු පාඨමාලාව/ ආරක්ෂක පරිපාලන පාඨමාලාව / ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාව/ බලඇණි ආධාරක අවි පාඨමාලාව / කාලතුවක්කු උපදේශක පාඨමාලාව, ඉන්දියාවේ සහ පකිස්ථානයේ පැවැත්වෙන බෝම්බ නිෂ්ක්‍රිය පාඨමාලාව, ඇමරිකා එක්සත් ජනපදයේ පාබල උසස් පාඨමාලාව, එංගලන්තයේ පැවැත්වෙන සරඹ උපදේශක පාඨමාලාව වගේ විශේෂ පාඨමාලා හදාරන්නත් දේශීය වශයෙන් ක්‍රියාත්මක කරන එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් පාඨමාලාව, පැරෂුට් පාඨමාලාව ඇතුළු පාඨමාලා විශාල ප්‍රමාණයකට සහභාගි වෙන්නත් අවස්ථාව ලැබෙනවා. ඒ වගේම එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී සඳහා මාලි, සුඩාන්, ලෙබනන් වැනි රටවල සේවය කරන්නත් අවස්ථාව ලැබෙනවා.

යුද්ධ හමුදාවට එක්වෙන සියලුම දෙනා විශ්‍රාම වැටුපකට හිමිකම් කියනවා. ඒවගේම වාර්ෂික වැටුප් වර්ධක, නොමිලේ වෛද්‍ය පහසුකම් ( බිරිඳ , දරුවන් සහ දෙමාපියන්ද ඇතුළත්ව), නිල ඇඳුම් හා ආහාරපාන, ණය පහසුකම්, සුබසාධක දීමනා සහ පහසුකම්, විවාහක නිවාස පහසුකම්, නිදහස් රාජකාරී/ නිවාඩු ගමන් බලපත්‍ර ආදී සුබසාධක වරප්‍රසාද සහ පහසුකම් රැසකුත් හිමිවෙනවා. මේ තත්වයත් එක්ක රටේ තරුණයෝ යුද්ධ හමුදාවට බැඳෙන්න විශාල උනන්දුවකින් කටයුතු කරන බව පේන්න තියෙනවා.

ඒ තමයි වෘත්තීමයභාවයෙන් සන්නද්ධ වෙලා රට ගොඩනැඟීමේ මෙහෙවරට දායක වෙන්න මේ වෙද්දි යුද්ධ හමුදාවට බැඳිලා පුහුණුව ලබන ජවසම්පන්න තාරුණ්‍යයේ ඇත්ත කතාව. අපේ රටේ ඉන්න ජවසම්පන්න තරුණයින්ට තවමත් අවස්ථාව තියෙනවා යුද්ධ හමුදාව එක්ක එකතු වෙලා අභිමානවත් සේවයක් රට වෙනුවෙන් කරන්න. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ඔබ සියලු දෙනා සාදරයෙන් පිළිගන්න සූදානම්.

සටහන
කපිතාන් දිලංග ගුණතිලක
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය

# කොවිඩ් එන්නත ලබාදීමේ වැඩසටහනක් දඹුල්ලේ...



**53 වන පාබල සේනාංකයේ** සේනාංකාධිපති මෙන්ම කොවිඩ්-19 වසංගත පාලන මෙහෙයුම් දිස්ත්‍රික් සම්බන්ධීකාරක - මාතලේ, මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ උපදෙස් හා මගපෙන්වීම මත **දඹුල්ල** ආර්ථික මධ්‍යස්ථානයේ මුදල් අයකැමිවරුන්, නාට්ටාම්වරුන් හා එම මධ්‍යස්ථානයේ ආරක්ෂකයින් ඇතුළු කාර්ය මණ්ඩලයේ 1500 දෙනෙකු හට යුද්ධ හමුදා 5 වන වෛද්‍ය බලකායේ වෛද්‍ය නිලධාරීන් හා සෙබළුන් විසින් කොවිඩ් එන්නත ලබාදීමේ වැඩසටහනක් ඉකුත් මැයි 27 වන දින සිදුකෙරිණ.

මෙම අවස්ථාව සඳහා අමාත්‍ය ගරු ජනක බංඩාර තෙන්නකෝන්, පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රමිත බංඩාර තෙන්නකෝන් මෙන්ම මාතලේ දිස්ත්‍රික් සොබ්‍ය කාර්ය මණ්ඩලය සහභාගී වූහ.











## සිලාවත්ත ප්‍රදේශයේ ප්‍රජාසත්කාරක වැඩසටහනක්....

**24 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව** විසින් **සිලාවත්ත** "ලෑනි" ළමා නිවාසයේ ළමුන් 20 ක් සඳහා ඉකුත් මැයි 16 වන දින දානයක් පිරිනමන ලදී. එම අවස්ථාවට ඒකකයේ නිලධාරීන් ඇතුළු සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.



# නන්දන්කන්ඩාල් කඳවුරු බිමේ රුක් රෝපණයක්...

යුද්ධ හමුදාධිපති තුමන්ගේ "තුරු මිතුරු - නව රටක්" ව්‍යාපෘතියට සමගාමීව අඹ, දෙහි, කජු සහ පේර වැනි පළතුරු පැළ 200 ක් සිටුවීමේ ව්‍යාපෘතියක් **නන්දන්කන්ඩාල්** ප්‍රදේශයේ පිහිටි **652 වන බලසේනා** කඳවුරු භූමිය තුළදී සිදුකෙරිණි.



වන්නි ආරක්ෂක සේනා ආඥාපති සහ 65 වන සේනාංකයේ සේනාංකාධිපති ගේ මගපෙන්වීම යටතේ සිදුකෙරුණු මෙම වැඩසටහන සඳහා 652 වන බලසේනාවේ බලසේනාධිපති ඇතුළු එම බලසේනාවේ සියලුම නිලධාරීන් සහ සෙසු නිලයින් සහභාගී වූහ.



# තබ්බෝව ගම්වාසීන්ට ජල පිරිපහදු යන්ත්‍රයක්...

ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ හටපිරිස්වල ඉංජිනේරු දැනුම සහ **143 වන බලසේනාවේ** හටපිරිස්වල ශ්‍රම දායකත්වයෙන් **තබ්බෝව වැව** ප්‍රදේශයේ ගම්වාසීන්ට පිරිසිදු පානීය ජලය ලබාදීම සඳහා ජල පිරිපහදු කිරීමේ ඒකකයක් ස්ථාපිත කරන ලදී. මෙම ජල පිරිපහදු ඒකකය විවෘත කිරීමේ උත්සවය පසුගිය මැයි 02 වන දින පැවති අතර එම අවස්ථාව සඳහා සහභාගී වූ 143 වන බලසේනාවේ බලසේනාධිපති විසින් එය ගම්වාසීන් වෙත පවරා දුන්නේය.



මෙතෙක් කල් එම ප්‍රදේශයේ ජනතාව පානීය ජලය ලෙස භාවිතා කළ ජලය සෞඛ්‍යාරක්ෂිත නොවන බැව් හඳුනාගැනීමෙන් අනතුරුව 143 වන බලසේනාවේ බලසේනාධිපතිගේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම ජල පිරිපහදු කිරීමේ ඒකකය ස්ථාපිත කරන ලදී.

# වව්නියාවේ විෂබීජහරණ වැඩසටහනක්...






ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) බලප්‍රදේශය තුළ මාරාන්තික කොරෝනා වෛරසය මර්දනය කිරීම සඳහා ක්‍රියාත්මක වැඩසටහන් හි තවත් පියවරක් ලෙස විෂබීජහරණය කිරීම **562 වන පාබල බලසේනා මූලස්ථානය** යටතේ පාලනය වන 17 (සෙව්) ශ්‍රීලංසිරෙ ඒකකයේ භට පිරිස් විසින් ඉකුත් මැයි 16 වන දින **වව්නියාව නගරය** ආශ්‍රිතව සිදුකරනු ලැබූහ. මෙම අවස්ථාව සඳහා 562 වන පාබල බලසේනාධිපති ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

# වලස්මුල්ල රෝහලට කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක්...





රට තුළ සීඝ්‍රයෙන් පැතිරයන කොවිඩ් 19 වසංගතය හේතුවෙන් පීඩාවට පත් මහජනතාවට ප්‍රතිකාර කිරීම සඳහා **12 වන පාබල සේනාංකයේ** සේනාංකාධිපතිගේ මඟපෙන්වීම මත **වලස්මුල්ල** මූලික රෝහලේ ඉදිකරනු ලැබූ කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානය නවීකරණය කර ඉකුත් මැයි 10 වන දින වලස්මුල්ල රෝහල් කාර්ය මණ්ඩලය වෙත භාරදෙන ලදී.

121 වන පාබල බලසේනාධිපතිගේ අධීක්ෂණයෙන් යුතුව 23 වන ගජබා රෙජිමේන්තුව සහ 3 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ භටපිරිස් හි ශ්‍රම දායකත්වයෙන් නවීකරණය වූ මෙම මධ්‍යස්ථානය මඟින් ඉකුත් මැයි 10 වන දින සිට කොවිඩ් රෝගීන් වෙනුවෙන් ප්‍රතිකාර ආරම්භ කරන ලදී.




# සංවත්සර දිනයේ මතක සටහන්...

**11 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ** 27 වන සංවත්සරය පසුගිය දිනට යෙදී තිබුණු අතර, එයට සමගාමීව වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී.

අණදෙන නිලධාරී වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම, බෝධි පූජා පිංකම, සියලු නිල තේ පැන් සංග්‍රහය එම වැඩසටහන් අතර කැපී පෙනුණි.







# වප් මඟුල් උත්සවයක්...

**1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකාය** වෙතින් පාලනය වන රෙජිමේන්තු ගොවිපළ - පානළුව හි 2021 වර්ෂයේ යල කන්නයේ කුඹුරු අස්වැද්දීමේ ආරම්භක කටයුතු වෙනුවෙන් වප් මඟුල් උත්සවයක් ඉකුත් මැයි 04 වන දින එම කුඹුරු යායේදී පවත්වන ලදී.


ආරක්‍ෂක සේනා (බටහිර) ආඥාපතිගේ උපදෙස් මත 1 වන යුද්ධ හමුදා පොදුසේවා බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් සීඑස් දේමුණි ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහන සඳහා එම ගොවිපලේ වැඩබලන නිලධාරී අණදෙන ඇතුළු සෙසුනිලයින් පිරිසක්ද එක්වූහ.



# පරිත්‍යාගයක්...

කොවිඩ්-19 වෛරසය දිවයින පුරා පැතිරයාම හමුවේ **නැගෙනහිර** පළාතේ පොලිස් ස්ථාන 12 ක සේවය කරන පොලිස් නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා පුද්ගලික ආරක්‍ෂක ඇඳුම් කට්ටල 1000 ක් ඉකුත් මැයි 14 වන දින මඩකලපුව නියෝජ්‍ය පොලිස්පති වෙත ලබාදුන්නේය.

මෙම පුද්ගලික ආරක්‍ෂක ඇඳුම් කට්ටල තොගය පොලිසිය වෙත භාරදීමේ අවස්ථාවට **23 වන සේනාංකයේ** සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑන්එන් කොස්වත්ත ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ 231 වන බලසේනාවේ බලසේනාධිපති කර්නල් විජිත හෙට්ටිආරච්චි සහභාගි වූහ.



# MILITARY DISCIPLINE.


*Last week I was returning from Diyatalawa after some official work at SLMA. As it was a Friday, I did not go to Colombo for my work but instead decided to come home to spend the weekend at Matara, my hometown. I took the route via Wellawaya as it is the shortest and the most familiar route to me. By the time I was closing to Wellawaya, unfortunately my vehicle had an engine trouble. Luckily there was a garage nearby and after inspecting the vehicle, the mechanic at the garage told me that it might take about 2 to3 hours to rectify the trouble. Then I decided to use public transport to cover the rest of the journey and directed my driver and assistant soldier to get it rectified and report to Matara camp.*

*Wellawaya bus stand was so crowded with weekend travellers and other passengers. I had to remain in the queue for few minutes waiting for a bus. Then an already crowded bus came from Moneragala and stopped at the halt. With the arrival of the bus, the bus halt turned to a pandemonium with people shouting and grappling. I managed to resist and got into the bus hardly finding a space to keep my feet while my body was subjected to bending, pressing, hanging and leaning to maintain my equilibrium among the standing crowd amounting to the double the passengers who were seated. In a few minutes, bus started plying towards Matara along the harsh and dusty Wellawaya - Matara Road.*

*I started my journey cursing the entire transport system in the country while inhaling the smell of various kinds of perfumes mixed with sweat and spirits emanated from the passengers packed in the bus. Suddenly I noticed one passenger sitting in the seat beside me gazed at me with a friendly smile and seemed to be wanting to talk to me. I reciprocated him with a smile trying to recollect him. But nothing came to my mind about him. Suddenly he gestured me that he wanted to offer his seat to me. I was elated and flopped down on the seat thanking him with a broad smile. I thought he was about to get down. But until the bus reached Hambantota, he did not get down from the bus. Then I assumed that he is a kind hearted and considerate gentleman who wanted to share his seat. So I requested him to take his turn. Nevertheless, he politely denied the request.*

*By the time the bus reached Dikwella, many passengers had got down from the bus allowing this gentleman to sit next to me. Though I was bit sleepy, I had a strong urge to talk to this large hearted gentleman. I asked him why he offered me his seat despite he had to travel the entire journey. In reply, he asked me, "Sir, are you from the forces"? While telling him "Yes" with my rank and name, I questioned him whether he knows me. With some respectful tone he said that he is a retired soldier and never worked with me or knew me. But with my features he had guessed that I am a military officer. Further he went on to say "Sir, how can I sit comfortably when one of our officers is travelling standing uncomfortably?" I felt proud and honoured for this retired disciplined soldier.*

*On reaching the bus to Matara bus stand both of us got down from the bus. While walking with him out of the bus halt I noticed that this ex-soldier is limping. When I asked him why he was limping, he simply said that he is an amputee. I was shocked and asked him indignantly, why he offered me his seat despite his disability. He simply laughed and said "* අපේ සර් කෙනෙක් හිටගෙන යද්දී මට වාඩිවෙලා යන්න හිතුනේ නෑ සර්. *" I pat on his back gently and said goodbye to him. While waiting for the car to pick me to be taken home at the seaside in front of the bus stand, I lit a cigarette with contended mood thinking that "How lucky I am to be an officer of such a disciplined army fortified with disciplined and considerate soldiers" thanking my destiny once again for making me a military officer.*



**Maj Gen Keerthi Kottawatta**
**Director HR & HL - AHQ**
**Dte of Psy Ops (Over Looking)**

# රණවිරු දෑතින් හිසට සෙවණක්...





විජයග්‍රහණ දිනයට සමගාමීව "රණවිරු දෑතින් හිසට සෙවණක්" වැඩසටහන හා "රණවිරුවාගෙන් අත්වැලක්" යන තේමාව යටතේ **මනවාලපඩ්ඩිමුරිප්පු මාන්කුලම්** ප්‍රදේශයේ පදිංචි වී විග්නේශ්වරම් යන අයගේ පවුල වෙනුවෙන් නවතමයෙන් ඉදිකිරීමට නියමිත නිවසෙහි මුල්ගල තැබීමත්, සින්නසාලම්බන් ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ පදිංචි ආර් චන්ද්‍රකුමාර් යන අයගේ අඩක් නිමකළ නිවසේ ඉදිරි වැඩකටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීමත් සිදුකෙරිණ. **64 වන පාබල සේනාංකයේ** සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්පී කරුණාරත්න අයිජී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මැයි 18 වන දින මෙම කටයුත්ත සිදුවිය.

එම අවස්ථාව සඳහා 642 පාබල බලසේනාවේ බලසේනාධිපති, නිලධාරීන් හා රාජ්‍ය නිලධාරීන් පිරිසක් සහභාගී වූහ. අදාළ ඉදිකිරීම් හා අළුත්වැඩියා සඳහා දොන් ලක්ෂ්මන් ජයමහා සහ ශර්මනී ලක්ෂ්මන් යන මහත්ම මහත්මීන් විසින් මූල්‍ය දායකත්වය ලබාදෙනු ලැබූහ. මෙම ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු සඳහා 23 විජයබාහු හටපිරිස් ශ්‍රමදායකත්වය සපයනු ලබති.

# කොරෝනා මැඩලීමේ මෙහෙයුමක්...



**681 පාබල බලසේනා මූලස්ථාන** බලප්‍රදේශයේ කොවිඩ් 19 වෛරසය ව්‍යාප්තිය හේතුවෙන් පීඩාවට පත්ව සිටින ජනතතාවගේ සෞඛ්‍ය ආරක්ෂිතභාවයත් යුද්ධ හමුදාව හා මහජනතාව අතර සංහිඳියාව වර්ධනය කිරීමත් අරමුණු පෙරදැරිව වෛරස ව්‍යාප්තිය මඩපැවැත්වීම සඳහා ප්‍රජාසත්කාරක වැඩසටහන් පසුගියදා මැයි 16 වන දින සිදුකෙරිණි. ඒ අනුව 681 පාබල බලසේනා මූලස්ථානය යටතේ ස්ථාපිත 7 ගැමුණු හේවා "ඒ" කණ්ඩායම් බලප්‍රදේශයට අයත් **උදයාර්කට්ටු දකුණ ප්‍රදේශයෙහි** පිහිටි උදයාර්කට්ටු සතිපොළ විෂබීජහරණය සිදුකරන ලදී.

# යාපනය ප්‍රදේශයේ ජනතාවට සහන...



ආරක්ෂක සේනා (යාපනය) ආඥාපතිගේ අදහසකට අනුව ඉකුත් මැයි 26 වන දිනට යෙදී තිබූ වෙසක් පුර පසළොස්වක පොහොය දිනට සමගාමීව **4 වන බලඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුවේ** අණදෙන නිලධාරී මේජර් එච්ජීඑස් ගාල්ලගේ පීඑස්සී ගේ උපදෙස් හා මඟපෙන්වීම යටතේ එම ඒකක බලප්‍රදේශයෙහි ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් සඳහා වියළි සලාක පරිත්‍යාග කිරීමේ ප්‍රජාසත්කාරක වැඩසටහනක් පවත්වන ලදී.

මෙම අවස්ථාව සඳහා **523 වන බලසේනාවේ** බලසේනාධිපති බ්‍රිගේඩියර් නිශ්ශංක සමරදිවාකර ආර්එස්පී යූඑස්පී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගි වූහ.

# සර්ව සුභවාදීව "සිතීමේ කලාව"



සර්ව සුභවාදය නැතහොත් සියල්ල සිදුවන්නේ හොඳටය යන ආකල්පය බල සම්පන්න අවියකි. එය ඔබ ප්‍රබෝධමත්ව තැබීමට උපකාරී වේ. එමෙන්ම ඔබගේ දීර්ඝායුෂ වැඩි වීමටද එය උපකාරී වේ. මිතුරන් ඇතිකර ගැනීමටත් ජීවිතයට අවශ්‍ය සතුට සහ ජයග්‍රහණය අත්කර ගැනීමටත් සර්ව සුභවාදීව සිතීම ප්‍රයෝජනවත් වේ. බොහෝ අය තම අනාගතය යහපත් එකක් වේවායි සිතීමට පෙළඹෙති. එය ගුණාත්මක චින්තනයකි. ඔබගේ සිතුවිලි රටාවන් සාමාන්‍යයෙන් නිෂේධාත්මක තත්වයේ සිට ගුණාත්මක තත්වය දක්වා වෙනස් කර ගැනීමට හෝ වර්ධනය කර ගැනීමට හැකි නම් ඔබ සියල්ල නරක යැයි සිතන රටාවේ සිට නැතිනම් සර්ව අසුභවාදියෙක් නොවී සුභවාදියෙක් ලෙස වෙනස් වීමට හැකිවේ. කලින් පුරුදු හා ආකල්ප සහ සිතුවිලි වෙනස් කර ගැනීම තරමක් අපහසු කාර්යයකි. අප තුළ පවතින අසුභවාදී සිතුවිලි අඩුකර ගැනීමට සැලකිය යුතු වෑයමක් අවශ්‍ය වේ.

අපගේ සිතුවිලි මෙන්ම කථාවද සැමවිටම සුභවාදී විය යුතුය. අප්‍රියජනක නරක දේ ගැන කථා කරනවාට වඩා සතුටුදායක අත්දැකීම් ගැන කථා කිරීම මානසික සෞඛ්‍යයට ඉතා හොඳය. පුද්ගලයින් ගැන කථා කරනවිටත් වැරදි අයවලුන් හෝ නරක අයවලුන් ගැන කථා කරනවාට වඩා හොඳ පුද්ගලයින් ගැන කථා කිරීම ඉතා හොඳය. මෙවැනි පුද්ගලයින් සමාජය තුළ ඉතා අල්ප වුවද ඔවුන් ගැන වැඩිපුර කථා කිරීමට පුරුදු වන්න.

නිෂේධාත්මක අර්ථ දක්වන බොහෝ වචන අපි භාවිතා කිරීමට පුරුදු වී සිටිනෙමු. උදාහරණයක් වශයෙන් නැහැ, බැහැ, නරක, අවිනිශ්චිත, අමාරු, භය මෙවැනි වචන නිතරම නිෂේධාත්මක අර්ථ ප්‍රකට කරයි. ඉහත වචන ශබ්ද නගා කියවීමෙන් කිසි විටෙක සුභවාදී හැඟීමක් ජනිත නොවන බව වැටහෙනවා ඇත.

සුභවාදී හැඟීම් සහිත ඔව් මට පුළුවන්, හොඳයි, ලස්සන, විශ්වාස, පහසුයි, වැනි වචන ශබ්ද නගා කියවීමෙන් ඔබට සම්පූර්ණයෙන් වෙනස් මානසික තත්වයක් අත්විඳීමට හැකිවනවා ඇත. එම වචන තුළ ඔබ සුභවාදී තත්වයට හා දියුණුව කරා ගෙන යාමට සමත් බලයක් තිබෙන බව ඔබට වැටහෙනු නියතය. බුදු දහමේ එන සත්ත තුම්බ ජාතකයේ (ගිරා පැටව් දෙදෙනාගේ කථාව) මෙයට කදිම උදාහරණයකි. බොහෝ දෙනා කථාබහ කරන විටත්, නිෂේධාත්මක හැඟීම් හා අර්ථ ඇති වචන එහි නියම අර්ථය වටහා ගැනීමෙන් තොරව ප්‍රකාශ කරයි. මට කාලය නැහැ, මට මතක තබාගන්න බැහැ, මට මේ වැඩේ කරන්න පුළුවන් වෙයිද කියලා විශ්වාසයක් නැහැ, ඔහු මා විශ්වාස නොකරන බව සහතිකයි, හැම වෙලේම මා අවාසනාවන්තයි, වැනි යෙදුම් ස්වභාවයෙන්ම අසුභවාදීයි. බොහෝවිට අප තුළ සතුටක් ඇති කරන යම් දේවල් පවා "ඒක එච්චර නරක නැහැ" අදහස් ප්‍රකාශ කරනු ඔබ අසා ඇත.

මෙම අදහස් ප්‍රකාශ කිරීම කිසිසේත් වැදගත් නොවේ. එයින් සිදුවන එකම ප්‍රතිඵලය නම් අපගේ යටි සිත තුළ

**අපගේ සිතුවිලි මෙන්ම කථාවද සැමවිටම සුභවාදී විය යුතුය. අප්‍රියජනක නරක දේ ගැන කථා කරනවාට වඩා සතුටුදායක අත්දැකීම් ගැන කථා කිරීම මානසික සෞඛ්‍යයට ඉතා හොඳය. පුද්ගලයින් ගැන කථා කරනවිටත් වැරදි අයවලුන් හෝ නරක අයවලුන් ගැන කථා කරනවාට වඩා හොඳ පුද්ගලයින් ගැන කථා කිරීම ඉතා හොඳය. මෙවැනි පුද්ගලයින් සමාජය තුළ ඉතා අල්ප වුවද ඔවුන් ගැන වැඩිපුර කථා කිරීමට පුරුදු වන්න.**

පසුගාමී අදහස් ජනිත වීම පමණි. එබැවින් ඔබේ සංවාදයේදී පසුගාමී අර්ථ සහිත වචන සම්පූර්ණයෙන් ඉවත් කරන්න. මෙබඳු සරල පහසුකම් අදහස් හා යෙදුම් ඉවත් කිරීමට ඔබ භාවිතා

කරන සෑම දෙයක් සඳහාම හැකි තරම් ප්‍රත්‍යක්ෂ හෝ ධනාත්මක අගයෙන් යුත් වචන එකතු කළ යුතුයි.

ඔහු කථා කරන ආකාරය පිළිබඳ වැඩි අවධානයක් යොමුකිරීමෙන් විස්තරය වැඩිදියුණු කිරීමට අවස්ථාව ලැබේ. ඔබගේ කටහඬ උනන්දු කරන ජීවයක් තිබේදැයි සිතා බලන්න. ඉතා පැහැදිලි සරල ශබ්ද පිට කිරීමට හැකිතාක් උත්සහ කරන්න. වචන ශබ්ද කිරීම පැහැදිලි විය යුතුයි. වාක්‍යයක් අවසානයේ ඔබගේ කථාවේ ශබ්දය ඇසෙන තරම් රඳවා ගැනීමට අවශ්‍ය වේ. ඇතැම් අය කථා කරන අවස්ථාවේදී වාක්‍යයක් අවසානයේ කොටස් ශබ්දය කෙමෙන් මැකී යන හඬ ඔබට ඇසී ඇති බවට සැකයක් ඇත. එවැනි ව්‍යාග විලාසයක් කිසිදු සුභවාදී බවක් හෝ උනන්දු කරන ලක්ෂණයක් නොමැත.

සමහරවිට සුභවාදී චින්තනය ඉතාම සිත්ගන්නා සුළු ලක්ෂණය සිනාසීමට ඇති සූදානම විය හැකියි. ඔබට කුඩා සිනහවකින් සියල්ලන්ගේ සිත් ඇදගන්නෙකු විය හැක. එමෙන්ම ප්‍රසන්නව ප්‍රියමනාපව ජීවත්විය හැක. සුභවාදී ගතිලක්ෂණ විදහා පෑමට මෙය ඉතා වැදගත් අවියක් බව සත්‍යක්දැයි සිතා බලන්න. අසන්නාගේ සිත සනසන වදනක් දිගු කරගත් මුහුණින් යුතුව පැවසීමෙන් කිසිදු ඵලක් නොවේ. අපගේ හිත් නිරන්තරයෙන්ම සුභවාදී චින්තනය වෙත නැමෙන සුළු තත්වයේ පවතින්නේද යන්න මතකයේ තබාගත යුතුයි. අප අතින් වරදක් සිදුවේ යන බිය නිතරම සිත තුළින් ඉවත් කර ගත යුතුයි. ජීවිතයේ යම් ආකාරයක අවදානමක් දැරීමට ඔබ සූදානම් වීම අවශ්‍ය වේ. වෙන කිසිවෙකුටත් වඩා තමන්ට ජයග්‍රහණය ලැබීමට තිබෙන බව යන සිතුවිල්ල කෙරෙහි හොඳින් එල්බ ගන්න. ජයග්‍රහණය පළමු වාරය ආත්ම ශක්තියයි. සරලව සඳහන් කළොත් ඔබේ ජීවිතයට පහත සඳහන් නිගමනයන් එකතුකර ගතහොත් සුභවාදීකරණය වඩාත් පහසුවනු ඇත.

බුද්ධිමත්ව සහ සරල ලෙස සිනාසෙන්න. ඔබගේ අංගචලනය ගැන ප්‍රවේසම් වන්න.

පොරොන්දු ඉතා අඩුවෙන් භාරගන්න.

වර්ධනය සඳහා විවේචනයන් පැසසීමටත් ඉගෙන ගන්න.

නිතර සතුටු සිතින් ගත කරන්න. කරදර වේදනා කලකිරීම් වලට ඔබේ සිතහව යට කිරීමට ඉඩ නොදෙන්න.

විවෘත සිතක් තබාගන්න.

ලද දෙයින් සතුටු වීමට පුරුදු වන්න.

විවාදයට නොව සංවාදයට එළඹෙන්න.

ඔබේ වාරයේදී වුවද අන්‍යයට කථාකිරීමට ඉඩ දෙන්න. අන් අය ගැන කථා කිරීම අඩු කරන්න. අත්‍යාවශ්‍ය නොවුවහොත් පසු නොබසින්න.

ඔබ කෙරෙහි අපවාද ගැන උනන්දු නොවන්න. සෑම දෙයකටම සමාන වැදගත් කමක් දක්වන්න.

ඔබට හිමි දේ ලැබීමට අතිශය උනන්දු නොවන්න.

වචන ස්වභාවය යහපත්ව තබා ගන්න.

ශක්තිය හා තිළිණ ඔබ වෙත ලගාවේ.

ඔබ වැපුරූ දෙයින් ඔබට අස්වැන්න ලැබේ. එමෙන්ම නිසි කලට නිසි වැඩ සිතීමට පුරුදු වන්න.

1993 අප්‍රේල් මනහර සඟරාව ඇසුරෙනි...





# දඹුල්ලට කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක්...

දිනෙන් දින ඉහළ යන කොවිඩ්-19 රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා **53 වන සේනාංකයේ** භටපිරිස් **දඹුල්ල, ඉනාමළුව** ජාතික තරුණ සේවා සභා ගොඩනැගිල්ල අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත කරන ලදී. මෙම අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉකුත් මැයි 24 වන දින සිට කොවිඩ්-19 ආසාදිත රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීමට සූදානම්ව පවතී.

53 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ලබාදුන් උපදෙස් මත දඹුල්ල මූලික රෝහලේ සෞඛ්‍ය නිලධාරීන්ගේ සහ සේවකයින්ගේ සහය ඇතිව යුද්ධ හමුදා භටපිරිස් විසින් ඉදිකරනු ලැබූ මෙම අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයේ කොවිඩ්-19 වෛරසය ආසාදිත රෝගීන් 154 දෙනෙකුට ප්‍රතිකාර කිරීමේ හැකියාව පවතී. මෙම අවස්ථාව සඳහා දඹුල්ල රෝහලේ සෞඛ්‍ය නිලධාරීන් සහ සේවකයින්, රජයේ නිලධාරීන් සහ යුද්ධ හමුදා නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.





# නිලාවේලි සහ කන්තලේ නව ප්‍රතිකාර මධ්‍යස්ථාන නිරීක්ෂණය කරමින්..

ත්‍රිකුණාමලය ප්‍රදේශය තුළ වෛරසය ආසාදනය වන පුද්ගලයින් හට ප්‍රතිකාර කිරීම සඳහා ත්‍රිකුණාමලය **නිලාවේලි ගෝපාලපුරම්** ප්‍රදේශයේ සමෘද්ධි නිලධාරී පුහුණු මධ්‍යස්ථානය සහ **කන්තලේ** යොවුන් සේනාංක මධ්‍යස්ථානයෙහි පසුගිය මැයි 10 වන දින 221 වන හා 222 වන බලසේනාධිපතිරු නිරීක්ෂණ චාරිකාවකට එක්වූහ.

මෙම ප්‍රතිකාර මධ්‍යස්ථාන ත්‍රිකුණාමලය දිසාපති සමන් දර්ශන මහතා, **22 වන සේනාංකයේ** සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ ත්‍රිකුණාමලය නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ යන නිලධාරීන්ගේ උපදෙස් පරිදි යුද්ධ හමුදා සෙබළුන්ගේ ශ්‍රමදායකත්වයෙන් ස්ථාපනය කෙරිණි.





# වාසවිලාන්හි නිරෝධායනය අවසන් කරමින්...

**521 වන පාබල බලසේනා මූලස්ථානය** යටතේ පාලනය වන **වාසවිලාන්** නිරෝධායන මධ්‍යස්ථානය වෙත පසුගියදා විදෙස්ගතව පැමිණ සිටි පුද්ගලයින් 96 දෙනෙකු නිරෝධායන ක්‍රියාවලියකට යොමු කෙරිණි. පුරා සති දෙකක නිරෝධායන කාලසීමාවකින් පසු ඔවුන් ඉකුත් මැයි 18 වන දින තම ගම් බිම් බලා පිටත් කර හරින ලදී. ඔවුන් හට පැල්මඩුල්ල, බදුල්ල, පොතුවිල්, මාතර, වත්තල සහ මහියංගනය ගමනාන්තයන් දක්වා ප්‍රවාහන පහසුකම් යුද්ධ හමුදාව විසින් සලසන ලද අතර ගමනේදී පරිභෝජනය සඳහා කෙටි ආහාර, දිවා ආහාර පාර්සල් මෙන්ම පිරිසිදු පානීය ජල බෝතල් ද ලබාදෙන ලදී.

# ඩෙංගු මැඩලීමේ වැඩසටහනක්...





නැවත හිස ඔසවන ඩෙංගු මදුරු උවදුර සහ පාතේනියම් ශාකය මර්දනය කිරීමේ අරමුණින් යුතුව **551 වන පාබල බලසේනාවේ** අධීක්ෂණය යටතේ යාපනය දිස්ත්‍රික්කයෙහි උඩුප්පිඩ්ඩි සිට පේදුරුතුඩුව දක්වා දිවෙන **කරණවායි** මාර්ගය දෙපස පිරිසිදු කිරීමේ වැඩසටහනක් ඉකුත් මැයි මස 11 වනදින පවත්වන ලදී. එම කටයුත්තට 4 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සහ 16 (සෙව්) බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදා සෙබළුන්ගේ මෙන්ම ප්‍රදේශවාසීන්ගේ ශ්‍රම දායකත්වය හිමිවූහ.

# මිද්දෙණිය රෝහලට කොවිඩ් ප්‍රතිකාර ඒකකයක්...







රට තුළ සීඝ්‍රයෙන් පැතිරයන කොවිඩ් - 19 වසංගත තත්වය හමුවේ පීඩාවට පත්වන මහජනතාවට ප්‍රතිකාර කිරීම සඳහා **122 පාබල බසේමු** බලසේනාධිපතිගේ අධීක්ෂණය යටතේ **මිද්දෙණිය** ප්‍රාදේශීය රෝහලේ ඉදිකරනු ලැබූ කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානය පසුගිය මැයි 14 වන දින රෝහල් කාර්ය මණ්ඩලය වෙත භාරදෙන ලදී.

අදාළ ඉදිකිරීම් සඳහා 23 වන බලඇණිය ගජබා රෙජිමේන්තුව, 3 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව සහ ඉංජිනේරු සේවා රෙජිමේන්තුව යන ඒකකයන්හි භටපිරිස් විසින් ශ්‍රමදායකත්වය ලබාදෙනු ලැබූහ.



# විජයග්‍රාහී මාසයේ විරුවන් ගැන කියවමු...

ත්‍රස්තවාදය පරාජය කොට 12 වසරක් සපිරුණු විජයග්‍රාහී දිනය ඉකුත් මැයි 18 වන දිනට යෙදී තිබුණි. එම ඓතිහාසික දිනයට සමගාමීව යුදබිමේ සත්‍ය අත්දැකීම් ඇසුරින් ලියූ ග්‍රන්ථ දෙකක් එළිදැක්විණ. "මරණය මැදින් මුලතිව් සිට" නම් වූ නවතම කෘතියද "අවි බිමක ගිනියම" කෘතියෙහි නව මුද්‍රණයද ඒ අතර විය. මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලය මගින් ප්‍රකාශිත "රණවිරුවා" සඟරාවේ ප්‍රධාන සංස්කාරක ලෙස කටයුතු කරන මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ එහි කතුවරයාය. පවතින කොරෝනා වසංගත තත්වය හේතුවෙන් සැලසුම් කොට තිබූ පරිදි අදාළ ග්‍රන්ථ දොරට වැඩීමේ උත්සවය නොපැවැත්වුණු නමුත් කතුවරයා විසින් එම කෘතීන් පසුගියදා යුද හමුදාධිපතිතුමා වෙත යුද්ධ හමුදා මූලස්ථානයේදී පිළිගන්වන ලදී. වසර 2009 ට පසු යුද්ධ හමුදාවට බැඳුණු අයවලුන් සේම ක්‍රියාන්විතවලට දායක වූ අත්දැකීම් සහිත අයවලුන් ද එකලෙස කියවිය යුතු මෙම කෘතීන් තුළින් යුද බිමෙහි බිහිසුණු ස්වභාවය, රණවිරුවන්ගේ අපරිමිත කැපකිරීම හා වීරත්වය පිළිබඳ කදිමට කියාපායි.

දශක තුනක යුධ ගැටුම් පැවති උතුරු නැගෙනහිර බිම්කඩ පුරා අද පැතිර පවත්නේ නිහැඬියාවකි. යුද්ධය නිම වී ගෙවුණු දොළොස්වසක් මුළුල්ලේ එකී නිහඬ බිම තුළ සංවර්ධන සංග්‍රාමයක් ඇරඹිණ. එකී සංවර්ධන ක්‍රියාදාමය හමුවේ ඉදිවූ තාර හා කොන්ක්‍රීට් පුරවරය යට නිහඬව වැළලෙන්නාවූ කතාන්දර අපමණය. තිස්වසක් පුරා පැවති යුද්ධයෙහි කොටස්කරුවන් හා අතරමැදි අයගේ පා සටහන්, දුක් සුසුම් හා ලේ කඳුළු සැඟවුණු එකී නිහඬ කතාන්දරවලින් අංශු මාත්‍රයක් පාඨකයා හමුවේ කියන්නට කතුවරයා මෙමගින් දරා ඇති උත්සාහය සැමගේ අවධානයට බඳුන්විය යුතුමය.










1996 ජුලි මස සිදුවූ ප්‍රහාරය යනු තිස්වසක යුද ඉතිහාසය තුළ ත්‍රස්තවාදීන් හමුවේ අප ලැබූ දරුණුතම පසුබෑමකි. එහිදී විනාශ වූ ජීවිත සංඛ්‍යාව 1,400 කට ආසන්න වූ අතර, අහිමි වූ හමුදා දේපළ ද අතිවිශාලය. නමුත් එම සටනේදී සතුරා කොතරම් බලවත් වුවද අවසන් මොහොත තෙක් නොබියව ඔවුනට මුහුණදුන් විරුවන් සේම ජීවිත බේරාගෙන පැමිණීමට සමත් වූ පිරිසක්ද සිටි බව බොහෝ දෙනෙකු නොදනී. එම ප්‍රහාරය හමුවේ දිවි බේරාගත් අතළොස්සක් දෙනා අතර 6 වන විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් නිලධාරියෙකු හා සෙබළු 20 දෙනෙකු වූහ. එම පිරිස අතරින් 10 දෙනෙකු දිවි බේරාගන්නා ලද්දේ ප්‍රහාරය අතරතුර කඳවුරු මධ්‍යයේ නිවසක වහලයේ සිමෙන්තියෙන් බඳින ලද අතහැර දැමූ කුඩා වතුර ටැංකියක සැඟවෙමිනි. බීමට දිය උගුරක් හෝ කුසට කිසිදු අහරක් නොමැතිව දින ගණනාවක් ගතකරන ඔවුන් අවසන් මොහොතේ සිය ජීවිත බේරාගැනීමට සමත් වනුයේ සතුරු භූමියේ කිලෝමීටර් 30 කට ආසන්න දුරක් ඇවිද එමින් සති ගණනාවක් තිස්සේ කළ අසීමිත කැපකිරීම් හමුවේය.




1990 කොකාවිල් ප්‍රහාරය වූකලී පසුගිය තිස් වසරක යුද ඉතිහාසය තුළ සිදුවූ බිහිසුණුම හා සංවේදීම සිදුවීමකි. එවක කොකාවිල් හි පිහිටි රූපවාහිනී සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයෙහි සේවයේ නියුතුව සිටි 61 දෙනෙක් අතුරින් හමුදා භටයෝ 54 දෙනෙකු හා සිවිල් සේවකයෝ 4 දෙනෙකු එම ප්‍රහාරය හමුවේ තම ජීවිත පූජා කළ අතර තිදෙනෙකු පමණක් දිවි බේරාගැනීමට සමත් වූහ. ප්‍රමාණවත් තරම් ආහාරපාන හෝ පතරොම් නොමැතිව පුරා දින විසිහයක් සතුරාට යටත් නොවුණු ඔවුන් කඳවුර අතහැර පලා ඒමට උපදෙස් ලැබී තිබියදීත් තුවාල ලත් තම සගයින් දමා යා නොහැකි බැවින් මියෙන තුරුම සටන් වැද තම ජීවිත රට වෙනුවෙන් පුද කළේය. ඉහත ක්‍රියාදාමයට දායකත්වය ලබාදුන් 2/ලුතිනන් සාලිය අලදෙනිය පසුව කපිතාන් නිලයට උසස් කොට රණවිරුවෙකුට පිරිනමන ඉහළම සම්මානය වන "පරම වීර විභූෂණයෙන්" පවා පිදුම් ලැබුවේය. එසේම, ඉතිහාසයේ ප්‍රථම වතාවට එම සම්මානය හිමිකරගත් නිලධාරියා වන්නේද ඔහුය.

කාලයේ වැලිතලාවෙන් වැසීගිය යුදබිම තුළ සිදුවූ ඉහත අප්‍රකට සංවේදී කතා පුරා වසර තුන බැගින් කතුවරයා විසින් සිදුකළ අඛණ්ඩ හා ගැඹුරු ගවේෂණයකින් අනතුරුව සත්‍ය හා විශ්වසනීය තොරතුරු මත පදනම්ව මෙලෙස ඔබ වෙත තිළිණ කෙරෙනුයේ උපන් බිම වෙනුවෙන් උතුම් දිවි කැප කළ එකී විරුවන්ට උපහාර පිණිසමය. පොත් පිළිබඳ වැඩි විස්තර දැනගැනීම සඳහා 071 0545710, 077 2649344 යන අංක ඔස්සේ කතුවරයා හා සම්බන්ධ වියහැක.



# කිලිනොච්චි වැසියන් වෙනුවෙන් ප්‍රජාසත්කාරයක්...

සිංහල හා හින්දු අවුරුදු උදාවට සමගාමීව කිලිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ උපදෙස් පරිදි **66 වන සේනාංක බලප්‍රදේශයේ** අඩු ආදායම් ලාභී පවුල් 100 ක් සඳහා ඇසුරුම් කරන ලද අත්‍යවශ්‍ය භාණ්ඩ තොගයක් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් මස 09 වන දින පැවැත්විණි.



එහිදී එක් පවුලක් සඳහා රු. 7200 ක් පමණ වටිනා වියළි සලාක මල්ලක් බැගින් ලබාදුන් අතර, මෙම අවස්ථාව සඳහා කිලිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති, 66 වන සේනාංකයේ සේනාංකාධිපති, එම සේනාංකයට අයත් බලසේනාවන්හි බලසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරිවරු ඇතුළු නිලධාරීන් සහ සෙසු නිලයින් සක්‍රිය දායකත්වය ලබාදෙනු ලැබූහ.






# කොවිඩ් මර්දනයට එක්වෙමින්....



යාපනය දිස්ත්‍රික්කය තුළ කොවිඩ්-19 වෛරසය සීඝ්‍රයෙන් පැතිරයාම අවම කිරීමේ සත්කාරයක් ලෙස යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සංකල්පයකට අනුව **අච්චුවේලි** නගරය, බස්නැවතුම්පොළ, පොදු වෙළඳ සංකීර්ණය, බැංකු සංකීර්ණය, සාප්පු සංකීර්ණය හා ඒ ආශ්‍රිත මාර්ගය සෝදා විෂබීජහරණය කිරීම ඉකුත් මැයි 15 වන දින සිදුකෙරිණි.

මෙම වැඩසටහන **52 වන පාබල සේනාංකයේ** සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්එච්කේඑස් පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ මඟපෙන්වීමෙන් හා 521 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් එම්එම් සල්වතුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණයෙන් සිදුවිය.







# කොවිඩ් මැඩලීමට උරදෙමින්...

**55 වන පාබල සේනාංකයේ**
සේනාංකාධිපතිගේ උපදෙස් පරිදි 551 පාබල බලසේනාව යටතේ ස්ථාපිත 16 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව සහ 4 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ භටපිරිස් විසින් කොවිඩ් 19 වැළැක්වීම පිළිබඳව සිවිල් වැසියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 29 සහ 30 යන දෙදින තුළ පවත්වන ලදී. මෙහිදී කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තිය වැළැක්වීම සහ ආරක්‍ෂාවීම සඳහා මුඛ ආවරණ පැළඳීම, සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම වැනි කරුණු පිළිබඳ මහජනතාව දැනුවත් කර ඔවුන් සඳහා මුඛ ආවරණ බෙදාදීමක්ද සිදුකරන ලදී.

මෙම සමාජ සත්කාරය සඳහා ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය නිලධාරීන්, පොලිස් නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් සහ රාජ්‍ය නිලධාරීන් සහයෝගය ලබාදුන්හ.





# දැනුවත් කිරීමේ වැඩසටහනක්...

**641 වන පාබල බලසේනා බලප්‍රදේශයේ**
ජීවත්වන සිවිල් ජනතාව හට කොරෝනා වෛරසයෙන් ආරක්‍ෂාවීම සඳහා සෞඛ්‍යාරක්‍ෂිත උපදෙස් ලබාදීමේ වැඩසටහනක් ඉකුත් මැයි 01 වන දින පැවැත්විණ.

මෙම වැඩසටහන සඳහා 14 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් චරිත් අතුල්දොරආරච්චි යූඑස්පී ඇතුළු එම ඒකකයේ නිලධාරීන්, සෙසුනිලයින් සහ **කච්චිලාමඩු** ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්‍ෂක සහභාගී වූහ.



# පාඨමාලා දක්ෂතම්...

**6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායට** අයත් සෙ/677760 සැරයන් විජේසිංහ ආර්ඩී යන ජේෂ්ඨකොණෙතානි 2020.07.07 දින සිට 2021.04.07 දින දක්වා යුද්ධ හමුදා සංගීත හා රංගකලා පුහුණු පාසල - පනාගොඩහි පවත්වන ලද තූර්ය වාදක නායක පාඨමාලාව සඳහා සහභාගිවී ඉන් ප්‍රථම ස්ථානය ලබා ගනිමින් තම රෙජිමේන්තුව වෙත මහත් කීර්තියක් අත්කරදීමට සමත් වී ඇත.

තත් ජේෂ්ඨකොණෙතානිගේ දක්ෂතාවය පොලිස් සේවා බලකා බලකාධිපති මේජර් ජෙනරාල් එල්පීආර් ප්‍රේමලාල් විසින්ද ඇගයීමට ලක් කරන ලදී.

# දිනූ බිම රකින්නට තරුණ ජවය...

අතිගරු ජනාධිපති තුමන්ගේ සංකල්පයකට අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපතිගේ ඉදිරි උපාය මාර්ග ක්‍රියාවට නැංවීමේ අරමුණින් 2021 වර්ෂය සඳහා ආධුනික සෙබළුන් 20000 ක් බඳවා ගැනීමේ ව්‍යාපෘතියෙහි පළමු අධියර යටතේ බඳවා ගන්නා ලද ආධුනිකයින් 359 දෙනෙකු සඳහා ආධුනික පුහුණු පාඨමාලාව පසුගියදා ආරම්භ කරන ලදී. මෙම පාඨමාලාව ආරක්ෂක සේනා (යාපනය) ආඥාපතිගේ පූර්ණ අධීක්ෂණය යටතේ **52 වන පාබල සේනාංක බලඇණි පුහුණු පාසල - විඩත්තපළෙලෙ** හිදී පැවැත්වේ.

ශ්‍රී ලංකාවේ සියලු පළාත් ආවරණය කරමින් සිංහල තරුණයින් 222 ක්, දමිළ තරුණයින් 98 ක් සහ මුස්ලිම් තරුණයින් 39 දෙනෙකු වශයෙන් විවිධ ජන වර්ග නියෝජනය කරමින් එලෙස ආධුනික සෙබළුන් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත එක්ව තිබීම සුවිශේෂී කරුණක් විය.



මෙහි ආරම්භක දේශනය 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් සිදුකළ අතර, 522 වන පාබල බලසේනාධිපති, ඒකක අණදෙන නිලධාරීන් රැසක් මෙම අවස්ථාව සඳහා සහභාගි වූහ.







# උරුම්පිරායි වැසියන්ට මාහැඟි පරිත්‍යාගයක්...

**51 වන පාබල සේනාංකයේ** සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ මෙහෙයවීමෙන් එම බලප්‍රදේශයට අයත් **උරුම්පිරායි දකුණ සහ සෙල්වපුරම් ප්‍රදේශවල** ජීවත්වන අඩුආදායම්ලාභී පවුල් 300 ක් සඳහා වියළි සලාක මළු සහ දිවා ආහාර පාර්සල් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 26 වන දින, එනම් බක් පුර පොහොය දිනයට සමගාමීව පවත්වන ලදී.

# කිලිනොච්චියේ දිළිඳු පවුල් වෙත පරිත්‍යාගයක්...

කිලිනොච්චි ඉදිරි නඩත්තු පෙදෙස ආඥාපති මේජර් ජෙනරාල් එම්අයිපී නානායක්කාරවසම් ගේ උපදෙස් මත ආරක්‍ෂක සේනා මූලස්ථානය **(කිලිනොච්චිය) බලප්‍රදේශය** තුළ විවිධ දුෂ්කරතා මධ්‍යයේ දිවිගෙවන පවුල් සඳහා සහනයක් ලබාදීමත්, ප්‍රදේශයේ ජනතාව හා යුද්ධ හමුදාව අතර සමගිය හා සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීමත් අරමුණු කරගනිමින් පවුල් 64 ට වියළි සලාක මලු බෙදාදීම ඉකුත් අප්‍රේල් 11 වන දින සිදුකෙරිණි.

බලප්‍රදේශය තුළ ස්ථාපිත හටකාර්ය සම්පාදන ඒකකවල හටපිරිස්හි මූල්‍යමය දායකත්වය මත අදාළ පරිත්‍යාග සිදුකරන ලදී.





# රණවිරු පවුලකට සෙවණක්...



**11 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ** සේවයේ නියුතුව සිට මියගිය සැරයන් කුමාරසිංහ පේ යන රණවිරුවාගේ පවුලේ ඥාතීන් වෙත වත්තේගම ප්‍රදේශයේ ඉදිකළ නව නිවසක් පසුගිය අප්‍රේල් මස 29 වන දින ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් පීජ්පේ පීරිස් එන්ඩියූ ගේ සුරතින් භාරදීම සිදුකෙරිණ.




# ලෝක ගිනස් වාර්තා පොත

ගිනස් නම් වන ලෝක වාර්තා පොතට තමන්ගේ නම ඇතුලත් කරගැනීම ජීවිතයේ මහගු භාග්‍යයකි. ඒ සඳහා ගත් උත්සාහයන් ව්‍යවර්ථ වී අකල්හි දිවියෙන් සමුගත් උදවියද හිග නොවේ. මීට කාලයකට ඉහත අප රටේද මෙවන් උත්සාහ කළ සමහරු වූහ. එය ගිනස් උන්මාදය ලෙසින් ඇතැමුන් හැඳින්විය.

ගිනස් වාර්තා පොත යනු කුමක්ද? එය ඇත්තේ කොහේද? ඊට නම නම එක්කර ගන්නේ කෙසේද? ගිනස් වාර්තා අතරට එක්වන්නේ කුමන ආකාරයෙන්ද? ඔබත් ඒ ගැන සිතන්නට ඇති. ගිනස් වාර්තාවක් තැබීම ලෙහෙසි පහසු කාර්යයක් නොවේ. කෙසේ නමුත් මෙම වටිනා ග්‍රන්ථයට මුල්වූයේ කුරුල්ලන් වීම තවත් විශේෂයකි.

දිනක් ශ්‍රීමත් හියු බීවර් අයර්ලන්ඩිහි සංචාරයේ යෙදී සිටියදී දුටු කුරුල්ලෙක් ඔහුගේ නෙත ගැටුණි. අත තිබූ තුවක්කුව ඔහු වෙතට යොමු වුවද ඉලක්කය වැරදී ගිය ඔහු යුරෝපයේ වේගවත්ම පක්ෂියා ඌ බව තීරණය කළ අතර, තම මතය ඒත්තු ගැන්වීමට පුස්තකාල ගණනාවක් පීරා තොරතුරු විමසා බැලීය. ඔහුට සාර්ථක පිළිතුරක් නොලැබුණි. මේ විස්තර සොයා යද්දී ඔහුගේ හිතට හැගුනේ එවන් ලෝක වාර්තා පොතක් නැතිකමේ අඩුපාඩුවය. ගිනස් වාර්තා පොත ඇරඹීමේ නිමිත්ත 1952 දී එසේ සිදුවිය. ඒ වෙනුවෙන්ම 1954 දී ප්‍රකාශන ඒජන්සියක් පවා පිහිටුවාගෙන අධිපතිකම නොරිස් සහ රෝස් මැක්විර්ටර් දෙදෙනාට පවරා ලෝකයේ අපූරුතම සිද්ධි හා වාර්තා මුද්‍රණය කිරීමට හෙතෙම පියවර ගත්තේය. වසරකටත් වඩා අඩු කාලයකදී පිටු 198 කින් යුත් ප්‍රථම ගිනස් වාර්තා පොත එළිය දුටුවේ 1955 අගෝස්තු 27 වැනිදාය.

හිතුවාටත් වඩා ඉහළ ජනප්‍රියත්වයක් ලැබීම ඔවුන්ගේ සතුටට හේතුවිය. මුල් මුද්‍රණය වහා අලෙවි වූ අතර, ඒ ලැබූ ධෛර්යය නිසාම නිව්යෝක් මුද්‍රණාලය පිහිටුවා දෙවැනි මුද්‍රණයද නිකුත් කළේය. එහි ඇතුළත් වන්නේ මනුෂ්‍යයින්ගේ හපන්කම් පමණක් නොවේ. දිගම කොණ්ඩය, විශාලතම ගෝරිල්ලා, බර වැඩිම කුරුළු කැදැල්ල, ලොකුම කැස්බෑවා, දැවැන්ත මාල, කුඩාම ග්‍රහලෝකය, විශාලතම සපත්තුව ආදී කරුණුද වෙයි. යකඩින් නිමකළ පාපැදියක් අනුභව කළ මිනිසෙකු ගැනද තොරතුරු ගිනස් වාර්තා පොතට ඇතුලත් වී තිබේ. මේ අතරින් අපහසුම කර්තව්‍යයන් නිමකළ පුද්ගලයින්ගේ නම් විශේෂත්වයක් ගනී.

මේ වටිනා ග්‍රන්ථය භාෂා ගණනාවකින් ප්‍රකාශයට පත්වෙයි. එහි ජනප්‍රියත්වයට එය තවත් හේතුවකි. එහෙයින් ගිනස් සංස්කාරක මණ්ඩලයට වැදගත් කාර්යයක් පැවරී ඇති අතර, ලොව පුරා වාර්තාගත සිද්ධීන් ගැන නිරන්තර අවධානයෙන් සිටී. ලෝකයේ කොතනක එවැන්නක් සිදුවුවද ඊළග වෙළුමේ ඒ සම්බන්ධ අදාළ තොරතුරු, පසුබිම් වාර්තා, ඡායාරූප සමග පළවනු නිසැකය.

වාර්තා පොත් තිබෙන්නට බැරි නැත. නමුත් එය ලෝක වාර්තාවක් වීමට නම් ගිනස් වාර්තා පොතේ සඳහන් විය යුතුමය යන අදහස අද ලොව වටා මුල් බැසගෙන තිබේ. 1955 සිට මේ දක්වා මෙවන් ග්‍රන්ථයක් අඛණ්ඩව පවත්වාගෙන යාමද ලෝක වාර්තාවකි. කෙසේ වුවද, එදා කුරුල්ලාට තැබූ වෙඩිල්ලේ ඉලක්කය නිවැරදි වූයේ නම් ඇතැම්විට මෙවන් අගනා ග්‍රන්ථයක් බිහි නොවන්නට ඉඩ තිබිණ.

(පොත පත ඇසුරෙනි)

# ජීවිතයට යමක්...

★ පණුවන් ගසන ලද, කෙළ තැවරුණු ගඳ ගසන පිළිකුල් උපදවන කිසිම රසක් නැති ඇට කැබැල්ල බල්ලා ප්‍රීතියෙන් කයි. සක්දෙව් රජ ළඟදී වුවද ඌට සැකක් ලැජ්ජාවක් නැත. පහත් ගති ඇති මිනිසාද තමාට ලැබෙන නින්දාවන් ගණන් නොගන්නේ එලෙසිනි.

★ මෝඩයා සතුටු කිරීම පහසුය. හොඳින් උගත් අය සතුටු කිරීම ඊටත් වඩා පහසුය. මඳක් උගත් අය සතුටු කිරීම මහ බඹුටද කළ නොහැකි වැඩකි.

★ දෑසමන් මල් මෙන් උතුම් මිනිසුන්ගේද ඇත්තේ ගති දෙකකි. සියලු ලෝකයාගේ මස්තකයට යෑම හෝ වනයේ විසිරියෑම ඒ ගති දෙකයි.

★ දුකට පත්වූවන්ගේ ද ධෛර්ය විනාශ කරන්නට නොහැක. ගින්න යටිකුරු කළත් ගිනි දැල්ල යටිකුරුව නොයයි.

(පොත පත ඇසුරිනි)

# සමාජ සම්බන්ධතාවය

## යහපත් වනු පිණිස



යහපත් සමාජ සම්බන්ධතාවයන් ගොඩනගා ගැනීමට පහත සඳහන් ගුණාංග වර්ධනය කරගැනීම උපයෝගී වනු ඇත.

- හොඳ සවන් දෙන්නෙකු වීම.
- රහස් රකින්නෙකු වීම.
- අනෙයන්ගේ පෞද්ගලිකත්වයට ගරු කිරීම.
- අන් මත ඉවසීම.
- හාස්‍ය රසය ප්‍රිය කලද කිසිම විටෙක

අන් අය හා අන් අයගේ අදහස් උපහාසයට ලක් නොකිරීම.

- අන් අයගේ දක්ෂතා හැකියාවන් හා ජයග්‍රහණයන් අගය කිරීම.
- තම මතය නිවැරදි වුවත් එයම අවධාරණය කිරීමට උත්සහ නොකිරීම.
- යහපත් නිවැරදි අදහස් පිළිගැනීමට සිතේ නැඹුරුවක් ඇතිකර ගැනීම.
- පරාර්ථකාමීව පරාර්ථ චර්යාවල යෙදීම.
- හැමවිටම හැම තැනම තමන්ම හරි යන අදහසින් ඉවත්ව කටයුතු කිරීම.
- ඕනෑම විටෙක වරද පිළිගැනීමට, සමාව දීමට ආත්ම ශක්තියක් වර්ධනය කර ගැනීමට, අනුන්ගේ දුකේදී දුක්වීමට හා අනුන්ගේ සතුටේදී හදවතින්ම සතුටු වීමටත් සංවේදී සහ කම්පන හැඟීමක් වර්ධනය කරගෙන සිටීම.

(පොත පත ඇසුරිනි)



# කාල කළමනාකරණය

- නිතර වැඩක යෙදෙන්න
- ප්‍රමුඛතාවය අනුව වැඩ තෝරාගන්න.
- බොහෝ වැඩ කිරීම නොව ඵලදායි වැඩ තෝරාගන්න.
- හෙට මියයාවි යැයි සිතා සියලු වැඩ නිමා කිරීමට උත්සහ කරන්න
- තවත් සියවසක් ජීවත්වේවි යැයි සිතා කියවන්න
- විවේකය යනු නැවත වැඩ කිරීමට අවශ්‍ය ශබ්ධාකරන කාලය යයි සිතන්න

- මහ මඟ දුගියාට ද රජමැදුරේ නිරිඳාටද එක සමානව බෙදාහුන් දෙයක් ලෝකයේ ඇත්නම්, ඒ කාලයයි.
- කාලක්‍රියා කිරීම යනු කාලයට ඉඩ දී ක්‍රියාව නතර වීමයි.
- උපත විපත මැද්දේ ඇති කාලය ජීවිතයයි.
- මිනිසෙකු කාලක්‍රියා කිරීමට පෙර ලෝකයට යමක් ඉතිරිකර තබා යා යුතුයි.
- වයස යනු ජීවත් වූ කාලය අඟවන අංකයකි.
- කෙනෙකු තරුණ හෝ මහළු වන්නේ වයස දැක්වෙන ආකාරයෙන් නොව සිතුවිලි හා ක්‍රියාවලියෙනි.
- කිසි කෙනෙකුට කාලය මැරිය නොහැකිය. කාලය කා දැමිය නොහැකිය. කාලය විසින් අපව කා දමා මරා දමනු ඇත.
- බොහෝ දෙනෙකුගේ ප්‍රශ්නවලට පහසුම පිළිතුර වනුයේ කාලයා විසින් විසඳනු ලබන බවයි. නමුත් කාලය ප්‍රශ්නවලට පිළිතුර නොවේ.
- කාලය රන් හා සමානය. රත්‍රන් නම් මිලදී ගත හැක.

**එහෙත් කාලය?**

සෙ/3එච්02073 සාසෙ දිසානායක සීඑම්ආර්
3(සෙචි) විහාරෙ, ගාසෙය
(රණවිරුවා 2007 ජනවාරි කලාපයෙනි)




## සඳගිරු සෑය නමදිමු

අටමස්ථාන අනුරාධපුරේ තියෙන්නේ
ලෝක උරුම අඩවිය මෙයවන්නේ
හත් වෙනි සෑයත් එහි ඉදිවෙන්නේ
කළගුණ මිහිපිට අපිට තියෙන්නේ

යුද්දය නිමවී දොලොස් වසක් වන්නේ
මිය ගිය රණවිරු සිහි කරලන්නේ
අට ලෝ දහමයි මෙනෙහි කරන්නේ
මුණි ගුණ සුවඳයි අපි නමදින්නේ

අනුරාධපුරේ සඳගිරු සෑය සෑදෙන්නේ
අට දෝණක් බල මහිම ලැබෙන්නේ
සූවිසි මහා බුදුගුණ රැවි දෙන්නේ
ලක් අඹරේ මුදුන් මල් කඩ වන්නේ

අට දෝණක් ධාතුන් ලොවේ තිබෙනා
ඉන්එකදෝණක්අනුරාධපුරයේ තිබෙන්නා
සඳගිරු සෑයත් එහි වැජඹෙන්නා
සිරිලක තුළ බුදු සසුන දිලෙන්නා

මිය ගිය විරුවට සෙත සදමින්නේ
සඳගිරු සෑයයි අපි නමදින්නේ
මුණි ගුණයට බැති මෙත් වඩමින්නේ
රට දැය රැකු ඔබ මතු බුදු වෙන්නේ

දෙතිස් වසර යුද සාප නිවන්නේ
විරුවනි ඔබ ගත් වෙර සිහිවෙන්නේ
එක්සත් කළ රට අපිට තියෙන්නේ
මෙහෙවර සඳගිරු සෑය දරන්නේ

මිහිකත දෙව්වරු සෑය වඳින්නේ
විතරාගී බුදුගුණ බලයට වන්නේ
සම්බුදු ගුණබල මහිම පෙනෙන්නේ
සඳගිරු සෑයේද පිහිට ලැබෙන්නේ

මේජර් ජෙනරාල් ජී්ඒයිපේ බණ්ඩාර
ආර්ඩබ්ලිව්පි ආර්එස්පි යූඑස්පි එන්ඩියූ
සේනාංකාධිපති
54 සේනාංකය - මන්නාරම

## ලොක්ඩවුන් වූ ජීවිතේ

ලොක්ඩවුන් වූ ජීවිතේ
කෙදිග අවසන් වෙද අනේ
දිනෙන් දින සති ගණන් ගෙවුණා
ජීවිතය එක තැන අනේ...

මගට බැස ඇවිදින්න ආසයි
නිදහසේ පෙර දා ලෙසේ
බස්රියේ දුම්රියේ තෙරපෙන
මිනිස් රූ වෙද හෙට දිනේ...

කුරුල්ලෝ නිදහසේ පියාඹති
ගීත ගයමින් රිසි ලෙසේ
උන් විඳින නිදහසේ සොමිනස
මිනිස් අප හට කිම නැතේ...

සඳත් පායා යළිත් බස යයි
හිරුට එන්නට මග සදා
ජීවිතය ඒ ලෙසින් ඇරඹෙද
බලා සිටියෙමු නෙත් විදා...

සෙ/240640
බනි I වයිඑම්ඊඑන් කුලසේකර බංඩා
ප්‍රධාන ලිපිකරු
මව්මෙඅම

## බලා, සැනසෙමි

මගේ පපු තුරේ නිදන් වූ ආදරේ
සදා නුඹටයි මගේ වස්තුවේ
නුඹ දුර තියා මං නුඹ දිහා බලන්න
හිත හදන් ඉන්න බෑ මට තවත්....

ගෙවන හැම දවස් පැයේ
ඔබේ මතකයන් හිතේ
තෙරපෙමින් හිත රිදෙනවා හැමවෙලේ
කඳුලු වැගුණු හැම පැයේ
එන්න හිතෙනවා සැනින් ඔබ සොයා....

හිතේ දුක තදකරන් ඉවසගෙන ඉන්නවා
නුඹේ ඔය දෙනෙත සිහිවෙන නිසා
සුසුම් අතුරා හිතේ කඳුලු බොඳවී ගියා
නුඹ මගේ පණ නිසා

සෙ/2099971
කාසෙ වාසනා ජේඩබ්ලිව්පීජේ
1 ශිලයුකාබ

## මතක පේම


මුවට හසරැලි
නෙතට කඳුලැලි
සිතට සිතුවිලි....
වෙලා මගේ හිත....

පුරා හිටිහැටි
නොගිලිහෙනු යැයි
බැන්ද අතැගිලි
ගිලිහුනා දෝ....
අප කතාවට තබා නැවතිලි....

අපේ මතකය
අතීතෙකි අද
එහෙත් කොතනක හෝ
සිතේ හිඳ....
කොනිත්තනකොට
ඒ රිදුම් ගැන....
දුකක් නෑ මට....

නුඹට මා පෙම්
කෙරූ තරමට
සිරකරනු බෑ සෙනේ සිතකට
නතර වෙන්නට....
කියනු බෑ මට....

එන් ඉෂාන්ති
කෝට්ටේ








## තෙමගුල් දිනේ අසිරිය...

මෙත් කරුණාව උතුරන සදහම් අරණයි
හැම හදවතක සිල් සුවදෙති ගුණ බරණයි
සුන්දර වෙසග දින බැබළෙන සඳ කිරණයි
මගෙ රට දැයට දළදා සම්බුදුගෙ සරණයි

කෝවිඩ් අඳුර දුරලන්නට හතර කොණේ
පිළිවෙත් සුරකිමින් කවුරුත් වෙහෙස වුණේ
පැතිර් පිරිත් බලමහිමය වෙසග දිනේ
ඇත්තේ නිදුක් සුව ලැබ තුන්සරණි ගුණේ

නිවෙමින් සදහටම රෝදුක් ගිනි ජාලා
සහනය සතුට සුව හද පත්ලෙන් පාලා
ජීවන ගඟට එක්කොට සදහස් මේලා
තෙමගුල් දිනේ විහිදේ බුදුරැස් මාලා

සිහියට නගාගෙන සිවුබඹ විහරණය
කටයුතු කළොත් ඉටුවන්නේ අරමුණය
උතුරා ගොසින් ලය විල සම්බුදු ගුණය
මගෙ මුළු දැයට සෙතදේ තෙමගුල් දිනය

නාලාගිරි අලව් සකු සච්චක ආදී
දමනය කෙරුණු සැටි ඇත බුදු මග ඇදී
ඒ අනුහසෙන් මුළු දැයටම සෙත සැදී
සඳරැස් නැගේවා තෙමගුල් දිනයේදී

ආ මග කෙටිය යා යුතු මග තව දුරවෙයි
අද ගත් වෙහෙස මල්ඵල දෙන්නේ හෙටටයි
රණවිරු පියසටයි ජනපතිටයි දැයටයි
බැතිබර වෙසග දින තුන් සරණයෙ පිහිටයි

නැහැ බැහැ වදන් නැත බුදු හිමි ළඟ තිබුණේ
එහෙයිනි සසුන් කෙත මෙතුවක් කල් රැකුණේ
ජය මල් පිපෙන්නම අප දිනු හෙළ දෙරණේ
තෙමගුල් දිනේ අත්වේ ගුණ ඉන් සරණේ

සම්බුදු සමිඳු තෙවරක් වැඩි මේ බිමට
සදහම් එළිය විහිදුණි බැලු බැලු අතට
කෝවිඩ් අඳුර පහම් සුවදී සිතට
බැතිබර වෙසග දින කිරි ඉතිරේ හැඩට

කොස්කඳවල නන්දසේන වීරසිංහ

## අප්‍රිකාවට නොපාන සඳ...

සුන්දරයි ඉම්හිරියි
සුධානය පියකරුයි
වරෙව් තොපි වරෙව් තොපි
දැන් අපට හිටිය ඇති

තැග නොතැග හිටිය වුන්
එක එකා අහුලමින්
දිවා රෑ නිදි වැරුවේ
තගන්නට තොපෙ ගයිල්

පොදි ගැහුව බඩු මුට්ටු
හති වැටුණ හොඳටෝම
කරවුනා මහ දවල්
පෙළපාලි කරන්නට

උදාවිය ඒ දවස
හැරදමා පැමිණෙන්න
දෙමාපිය නෑදෑයො
ප්‍රිය බිරිඳ හා දරුවො

පසු කළෙම් මහ සයුර
ගිරි ශිඛර ගණ කැළෑ
පිළි ගනිම් අපි සැවොම
එක් රොක්ව හරසරින්

අර රටේ මේ රටේ
තුන් රටේ උන් සමග
හැපී හැපී වැටී වැටී
තරගයකි අසුන්දර

ඒ මේල් මේ මේල්
දිවා රෑ කොන්තරත්ස්
මේ මහ යුද්ධයක්
ඉංගිරිසි ගොතගහන

දිවා රෑ නිදි වරලා
පැතුම් මිටි පොදි ගහලා
සතුට නැති කර දමලා
ලැබුණු කිසි සෙතක් නැත

ඩොලර් මිටි පවුම් කොළ
රට බිම ඇත රහට
වෛවර්ණ රස මිහිර
මට කුමට නුඹට නැති

මැටි හැලියෙ උයාගෙන
සම්බෝලෙ අඹරගෙන
රසවින්ද අතීතය
කොයිතරම් සුන්දරද

නිමක් නැති අමාවක
නිරගෙයකි එළිමහන්
පුරා පුන් පෝ සඳක්
කවදාද පායන්නේ

මගේ රට අපේ රට
රකින්නට පණ සේම
විඳිමු හැම දුක් ගැහැට
එකා සේ එකට හිඳ

නිමක් නැති කම් කටොළු
නැතිකමද පාළුවද
දරාගමු එක සිතින්
මව්බිමේ නාමයෙන්

මේජර් (වෛද්‍ය) ඩබ්ලිව්පී ජයරත්න
බෝර් - දකුණු සුඩාන්

## පෙම් සිහිනේ...

කලක් නුඹ මගෙ නෙතෙහි ගැටුණත්
සිහින් විතරක් පෙම්කළා
ඉඩක් ලැබුණම නෙතෙහි බැල්මට
සිතහවට නුඹෙ ලංවුණා
පෙමක් ඇතිවද නුඹව කරගත්
තවත් හදකට ලංවෙලා
දොසක් පවසනු කලින් පවසම්
සිහින් විතරක් පෙම්කළා...

රැයක් නොනිදා විඩාබර නෙත්
රාජකාරියම ඉටුකළේ
නුඹගෙ සිනහවෙ මතක රසතැන්
හදෙහි රැව් පිළි රැව් තියේ
කිසිම දිනයක ලඟට විත් නුඹෙ
බස් හෙලන්නට බැරි උනේ
මමම දන්නා නුඹ නොදන්නා
අරුමයකි මේ ආදරේ...


යන්න මතකය අරන් කාලය
උදාවූවා ජීවිතේ
නින්දෙ දුටු සුව මිහිරි සිහිනය
කියා සැනසෙමි හදවතේ
වෙච්ච බැල්මෙන් පවා හිරිහැර
සමා අයදිමි මා ඔබේ
රැගෙන යන්නෙම් නුඹේ මතකය
සදා රැකගෙන ජීවිතේ...

සෙ/කිපු107185
ලා/කෝ සම්පත් කුමාර ඩබ්ලිව්ජීවන්
16 ශ්‍රීලංජාආබමු

## බිරිඳ...

නුඹව තේරුම් ගන්න බැරිව
කල්පනා කරමි තනිවම
නුඹට කළ වරදක් නැත තවම
දුරකථනය බිසි වුණොත් හෙම
ඇය සැක කරන්නේ
අනියම් පෙමක් ගැන...
තේරුම් කිරීමට නියමිව
මා වැරදි කරුවෙකු වී තමාරය
කෙදිනක හෝ තේරුම් ගනිව් නුඹ
ඔබ හැර කිසිවෙකු නොමැත මට...

සෙ/2එල්00815
කෝප්‍රල් චතුර කුමාර පිජීවන්
2(සේව) ශ්‍රීලයුමෙව්බ



# රණවිරු පූදසුන

## යුධෝපකරණ බලකා රෙජිමේන්තු ස්මාරකය...

යුධෝපකරණ බලකා රණවිරු ස්මාරකය 2001 වර්ෂයේ යුධෝපකරණ රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස කටයුතු කළ කර්නල් බීපීඑච්එස් මෙන්ඩිස් සහ එවකට 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ අණදෙන නිලධාරී වශයෙන් රාජකාරී කළ මේජර් එච්ජීඅයි විද්‍යානන්ද ඒජ්ටීඕ ශ්‍රීලයුයුබ ගේ ආරාධනයෙන් යුධෝපකරණ කර්නල් සේනාවිධායක බ්‍රිගේඩියර් ආර්එම්බීපී රණසිංහ යූඑස්පී විසින් වර්ෂ 2001.10.12 වන දින සැමගේ උත්තමාචාරය සඳහා නිරාවරණය කර ඇත.

යුධෝපකරණ බලකාය යටතේ රාජකාරී කර රටදැය වෙනුවෙන් දිවිපිදූ උදාර රණවිරුවන් සිහිකිරීමේ අරමුණින් මෙම ස්මාරකය ඉදිකොට ඇත. යුධෝපකරණ බලකා රෙජිමේන්තු ස්මාරකය 2001 වර්ෂයේදී 1 වන රෙජිමේන්තුව යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය - පනාගොඩ හි පිහිටුවන ලදී.



**රණවිරු ස්මාරකයේ විවිධ කොටස්වලින් පිළිබිඹු වන අදහස්**

**කාලතුවක්කු අවිය හා පතරොම්** - නිවැරදි දේ නිවැරදි ලෙස ලබාදීමේ සංකල්පය විදහා දැක්වෙන යුධෝපකරණ බලකා සංකේතය.

**සෘජුකෝණාස්‍රාකාර කොටුව** - ගාම්භීරත්වය


**පිටතින් පහළට ගලන ජලය** - කඳුළු (මියගිය රණවිරුවන් වෙනුවෙන් නැගෙන කඳුළු)

**පොකුණ** - ශක්තිය (මියගිය රණවිරුවන් වෙනුවෙන් සියලුදෙනා එකට එක්වී සිටින බව)

**සිව්කොණේ ඇති පුන්කලස්** - සෞභාග්‍යය
( ලක්දෙරණ වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් රට, ජාතිය, ආගම වෙනුවෙන් තම ජීවිත කැපකර උතුම් පරිත්‍යාගයෙන් ලබාගත් සෞභාග්‍යය)

ශ්‍රී ලංකාව තුළ දශක තුනකට ආසන්න කාලයක් පැවති රුදුරු යුද්ධයේදී ත්‍රස්තවාදීන් විසින් එල්ල කරන ලද මිලේච්ඡ ප්‍රහාරයන්ට ලක්ව තම මව්බිම බේරා ගැනීම වෙනුවෙන් යුධෝපකරණ බලකායට අයත් රණවිරු නිලධාරීන් 05 දෙනෙකු සහ සෙසුනිලයින් 56 දෙනෙකු ජීවිත පූජාකර ඇත.

ඉදිරිපත් කිරීම
ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය



**අපේ ජීවිතයට හානිකර තවත් භයානක පුරුද්දක් නම් පසුතැවිල්ලයි. පසුගිය දේ ගැන හෝ අනාගතයේදී ඇතිවිය හැකි තත්වයක් ගැන හෝ සිතමින් පසුතැවිලි වීම සිරුරට ඉතාමත් හානිකරයි.**

# ඔබ ආයුෂ කෙටි කර ගන්නවාද?

අප දිනපතා ගත කරන්නේ විවිධ ආකාරයේ පුරුදු හා ඇබ්බැහිකම් වලින් ගහන සංකීර්ණ ජීවිතයකි. අපේ ජීවිතයේ හැඩ ගැස්මත් එහි ආයුෂ ප්‍රමාණයත් පාලනය කරනු ලබන්නේ මේ ඇබ්බැහිකම් මගිනි.

අප නොයෙකුත් ආකාරයේ ඇබ්බැහිකම් වලට ගොදුරු වන්නේ නොයෙකුත් මානසික ඉරියව් හා පෙලඹවීම් හේතු කොටගෙනය. ඇබ්බැහිකම් නැත්නම් පුරුදු හොඳ හෝ නරක වශයෙන් අපට වෙන් කළ හැකිවන අතර, නවීන විද්‍යා ගවේෂකයින් විසින් සොයාගනු ලැබ ඇති පරිදි ජීවිතය කොට කරන සමහර විට වහාම මරණය පවා ගෙන දිය හැකි ඇබ්බැහිකම් ගැන පමණක් විමසා බලමු.

අපේ නරක පුරුදු අතරින් ඉතාම භයානක පුරුද්ද වශයෙන් විද්‍යාඥයින් හඳුන්වන්නේ වැඩියෙන් ආහාර ගැනීමය. මේ පුරුද්දට ඇබ්බැහිවී ඇති පුද්ගලයින් වැඩිවන තරමට වෛද්‍යවරුන්ගේ ආදායමද තරවන බව එක් විද්‍යාඥයෙක් පවසයි. තවත් විද්‍යාඥයෙක් පවසන අන්දමට සිරුර ස්ථූල කරන මස්, බටර්, බිත්තර ආදිය පමණක් නොව සීනි හා පැණි රස කෑමද සිරුරට හානිකරය. මෙවැනි ආහාර ගැනීම නිසා අධික රුධිර පීඩනය, දියවැඩියාව හා හෘදයාබාධ ඇතිවිය හැකිය. බිස්කට්, කේක්, අයිස්ක්‍රීම් ආදී පැණි රස බහුල ආහාර වලින් වැඩිපුර කැලරි ප්‍රමාණයක් සිරුරට ලැබෙන නමුත් සුළු ආහාර ප්‍රමාණයකින් බඩගින්න නොනිවෙන හෙයින් ඒවා සිරුරට හානිකර බව විද්‍යා ගවේශණවලින් හෙළිවී ඇත. ඔබ වැඩිකල් ජීවත්වීමට කැමති නම් ඔබේ ආහාරයට පලතුරු, එළවලු හා පළා වර්ග හැකි තරම් අඩංගු විය යුතුය.

වයස අවුරුදු හතලිහ පසු කළ විට එළවලු, පලතුරු, කිරි ආදී ප්‍රෝටීන් සහ විටමින් බහුල ආහාර වැඩියෙන් ආහාරයට ගත යුතුය. මෙවැනි ආහාර දිගා සිරි විඳීමට බෙහෙවින් උපකාරී වන බව විද්‍යාඥයෝ කියති.

අපේ ජීවිතයට හානිකර තවත් භයානක පුරුද්දක් නම් පසුතැවිල්ලයි. පසුගිය දේ ගැන හෝ අනාගතයේදී ඇතිවිය හැකි තත්වයක් ගැන හෝ සිතමින් පසුතැවිලි වීම සිරුරට ඉතාමත් හානිකරයි. මේ පසුතැවිල්ල හේතුකොට ගෙන මොළයේ සහ සිරුරේ සෛලයන් දිරා පත්වන බව විද්‍යාඥයන් විසින් සොයාගනු ලැබ ඇත. රුධිර ධාවනයත් හදවතේ ක්‍රියාකාරීත්වයත් ග්‍රන්ථීන් හා ස්නායු වල මනා පැවැත්මත් සිදුවන්නේ පසුතැවිල්ල සිතින් තුරන් වූ විට බව ඉංග්‍රීසි වෛද්‍ය විද්‍යාඥයෙකු වන මහාචාර්ය චාර්ල්ස් එච් මයෝ කියයි. මේ චෛතසිකය මැඩ පැවැත්වීම අපහසු වුවත් ආත්ම විශ්වාසය හා අවංකකම වර්ධනය කළ විට එය තුනී කරගත හැකිය.

ජීවිතයේ අධික සැප සේවීම හා සුඛෝපභෝගී භාණ්ඩ පරිහරණය හේතුකොටගෙන අපේ ආයුෂ කොටවන බව සොයාගෙන ඇත. සිරුරේ ලේ කැටි ගැසීම හා හෘදයාබාධ වැනි රෝග මෝටර් රථ පාවිච්චියත් සමග කිට්ටු සම්බන්ධතාවයක් ඇතැයි මහාචාර්ය ජෝන් යුඩ්කින් නම් විද්‍යාඥයා කියයි. තට්ටු දෙකේ බස් රථ පදවන රියදුරන්ද මේ රෝග වලට පහසුවෙන්ම ගොදුරු වන බව ජේකේ මුයලි නම් වෛද්‍ය විද්‍යාඥයාගේ අදහසයි.

ශරීරයට අවශ්‍ය ව්‍යායාම නොමැති විට වැළඳෙන තවත් රෝගයකි දියවැඩියාව. ව්‍යායාමය පහසුවෙන් ලබාගත හැකි ක්‍රම වශයෙන් විද්‍යාඥයන් අනුමත කරන්නේ පයින් ගමන් කිරීම, පිහිනීම, බයිසිකල් පැදීමයි. හදවත සම්බන්ධ රෝග කිහිපයකටම පිළියම බයිසිකල් පැදීම බව ලෝකයේ පළමුවන පෙළේ වෛද්‍ය විද්‍යාඥයෙකු වන මහාචාර්ය ඩඩ්ලි වයිට් කියයි. මෙය ක්‍රියාවෙන් පෙන්වන ඩඩ්ලි වයිට් දිනපතා රෝහලට පැමිණෙන්නේද බයිසිකලයෙනි. බයිසිකල් පැදීම කළ නොහැකි නම් දිනකට අඩු වශයෙන් සැතපුම් තුනක්වත් පයින් ගමන් කළ යුතුය. අපේ එදිනෙදා කටයුතු වලදී පමණක් නොව නින්දට යාමේදීත් උදයට අවදිවීමේදීත් ආහාර ගැනීමේදීත් එක්තරා කාල සටහනක් අනුගමනය කිරීම දිගාසිරි ලැබීම සඳහා ඉතාමත් අවශ්‍යය.

ජීවිතයේදී ඒ ඒ අවස්ථාවන්හි අප පුරුදු කර ගන්නා ඇබ්බැහිකම් වල සීමාවක් තිබිය යුතුය.

*1993 අප්‍රේල් මිහිර සඟරාව ඇසුරෙනි...*

වෘත්තීය දිවියේ නේකවිධ කඩඉම් පසුකොට
සුබ මොහොතින් නව තනතුරු ලැබූ
ඔබ සියලු දෙනාට දිරිය, විරිය, ඊශ්වර්යය ලැබේවායි "රණවිරුවා" දී
මෙසේ සුබ පැතුම් එක්කරයි.



11 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
මේජර් ජෙනරාල්
කේ ලියනගේ ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී එන්ඩියූ
2021 මැයි මස 07 දින සිට



52 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
මේජර් ජෙනරාල්
ඩබ්ලිව්ඩබ්ලිව්එච්ආර්එස් පීරිස්
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී
එන්ඩියූ
2021 මැයි මස 29 දින සිට



ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා
බලකායේ බලකාධිපති ලෙස
බ්‍රිගේඩියර්
ටීඑම් අබේරත්න ආර්එස්පී
එල්එස්සී
2021 මැයි මස 07 දින සිට



විජයබාහු පාබල රෙජිමේන්තුවේ
රෙජිමේන්තු මධ්‍යස්ථාන
සේනාවිධායක ලෙස
බ්‍රිගේඩියර්
ඩබ්ලිව්එස්එන් හේමරත්න
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී
2021 මැයි මස 01 දින සිට



අභිමංසල I සුවසහන
නිකේතනයේ සේනාවිධායක ලෙස
බ්‍රිගේඩියර්
එස්සී ඒකනායක ආර්එස්පී
2021 අප්‍රේල් මස 22 දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය
(මුලතිව්) බ්‍රිගේඩියර්
(පාලන/හකාස) ලෙස
බ්‍රිගේඩියර්
ඊසීඊ ද සොයිසා යූඑස්පී
එල්එස්සී
2021 මැයි මස 03 දින සිට



231 වන බලසේනාවේ
බලසේනාධිපති ලෙස
කර්නල්
ව්එම්එන් හෙට්ටිආරච්චි
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
2021 මැයි මස 01 දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය
(මධ්‍යම) කර්නල්
ප්‍රධාන මාණ්ඩලික ලෙස
කර්නල්
එම්එල්ඩීඑස් මොල්ලිගොඩ
යූඑස්පී පීඑස්සී
2021 මැයි මස 07 දින සිට



ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලයේ
කර්නල් ජනමාධ්‍ය ලෙස
කර්නල්
එච්ටීඩබ්ලිව් විද්‍යානන්ද
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී
2021 මැයි මස 03 දින සිට



2 වන ශ්‍රී ලංකා රයිෆල් බලකායේ
අණදෙන නිලධාරී ලෙස
ලුතිනන් කර්නල්
කේ ජයවීර
2021 මැයි මස 07 දින සිට



5 වන බලඇණිය ගැමුණු හේවා බලකායේ අණදෙන නිලධාරි ලෙස
**ලුතිනන් කර්නල්**
**කේඒඑල් දීපාල්**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**
2021 මැයි මස 20 දින සිට



122 පාබල බලසේනාවේ ජ්‍යේෂ්ඨ මාණ්ඩලික නිලධාරි ලෙස
**ලුතිනන් කර්නල්**
**එච්සේයූ නදික යූඑස්පී**
2021 මාර්තු මස 04 දින සිට



1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ අණදෙන නිලධාරි ලෙස
**ලුතිනන් කර්නල්**
**පීජේවී ධර්මසේන**
**යූඑස්පී පීඑස්සී එල්එස්සී**
2021 මැයි මස 10 දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ප්‍රධාන සිවිල් සම්බන්ධීකරණ නිලධාරි ලෙස
**ලුතිනන් කර්නල්**
**එන්යූජේඑස් ගුණවර්ධන**
2021 මැයි මස 14 දින සිට



12 වන පාබල සේනාංකයේ ප්‍රමාණි I (සම්බන්ධීකරණ) ලෙස
**ලුතිනන් කර්නල්**
**එච්එම්ආර් කුමාර ආර්එස්පී**
2021 මැයි මස 24 දින සිට



ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරි 1 ලෙස
**ලුතිනන් කර්නල්**
**ටීඑස්බීආර් ප්‍රනාන්දු**
2021 මැයි මස 07 දින සිට




ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ මාණි I (උසස් කිරීම් කණිෂ්ඨ) ලෙස
**ලුතිනන් කර්නල්**
**පීජීඑම් වික්‍රමසිංහ**
2021 මැයි මස 03 දින සිට



22 වන බලඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි ලෙස
**මේජර්**
**යූපීඩබ්ලිව් උදයරත්න**
2021 මැයි මස 10 දින සිට

# ඔබේ ලිපි නිර්මාණ ඕනෑ






සමස්ත යුද්ධ හමුදාවම නියෝජනය කරන එකම සඟරාව වූ "රණවිරුවා" වසර ගණනාවක පටන් අඛණ්ඩවම ඔබ අතට පත්කෙරේ. යුද්ධ හමුදාව තුළ සිදුකෙරෙන විශේෂිත සිදුවීම් මෙන්ම ක්‍රීඩා, සාහිත්‍ය, අධ්‍යාපනික, විදෙස් සහ ඉතිහාස තොරතුරුද ඇතුළත්ව විචිත්‍රවත් ලෙස හා හරවත්ව එළිදක්වන රණවිරුවා තුළින් ඔබගේ දැනුම හා රසාස්වාදය පිණිස මාහැඟි පිටිවහලක් ලැබී ඇති බැව් අප වෙත නිරතුරුව ලැබෙන ලිපි හා ඇමතුම් මගින් සනාථ වේ.

එහෙත් විවිධ අංශ අප වෙත ලිපි නිර්මාණ යොමු කළද යුද්ධ හමුදාවේ ඇතැම් ආයතන වෙතින් තොරතුරු ලැබෙනුයේ ඉතා අල්ප වශයෙනි. එනිසාම යුද්ධ හමුදාව තුළ සිදුකෙරෙන බොහෝ ක්‍රියාකාරකම් පිළිබඳව සෙසු අය දැනුවත් නොවන තත්වයක් පවතී. එබැවින් ඔබගේ ඒකකයේ, රෙජිමේන්තුවේ, බලසේනාවේ, පුහුණු පාසලේ හෝ කුමන ස්ථානයක වුවද සිදුවන විශේෂ වැදගත්කමින් යුත් තොරතුරු ඇත්නම් අපවෙත යොමු කරන්න. අප ඒවා අප්‍රමාදව රණවිරුවාහි පළකිරීමට කටයුතු යොදා ඇත. මාසිකව නොමිලේ ඔබ අතට පත්වෙන රණවිරුවා සඟරාව මගින් පාඨක ඔබගේ නිර්මාණශීලී හැකියාවන් වැඩිදියුණු කර ගනිමින් දැනුම හා තොරතුරු බෙදාහදා ගැනීමට එකතු වන්න.

සංස්කාරක - රණවිරුවා සඟරාව



## විද්‍යාව පංතිය...

**සර් -** ළමයි... අද අපි ඉගෙන ගන්නෙ හිරු සහ සඳ ගැන... නිමාලි කියන්න බලන්ඩ සඳ ගැන කරුණු තුනක්...

**නිමාලි -** හඳ සීතලයි, හඳ පෘථිවියේ උපග්‍රහයෙකි, හඳට මුලින්ම පා තැබුවේ නීල් ආම්ස්ට්‍රෝන්...

**සර් -** බොහොම හොඳයි... සිරිල් කියන්න බලන්ඩ හිරු ගැන කරුණු තුනක්...

**සිරිල් -** අපි හැමදාමත් අහන්නෙ හිරු, අපි කවදත් හිරුට ආදරෙයි, හිරු මගේ පණ වගේ...

## බෙහෙත් පානය...

**කුමාර් -** ඩොක්ට... මාසයක් ගියා... තවම අර ලෙඩේ හොඳ වුණේ නැහැනෙ... මොකක්ද ඒකට හේතුව...?

**ඩොක්ට -** මං ලියල දීපු බෙහෙත් බෝතලේම හරියට බිව්වද ඉවර වෙනකන්...?

**කුමාර් -** නෑ ඩොක්ට... මං බෙහෙත් බෝතලේ බොන්ඩ හදද්දි ඒකෙ ගහල තිබ්බ හොඳින් වසා ශීතකරණයේ තබන්න කියල... ඉතිං මං ඒක ෆ්‍රිජ් එකෙන් තිබ්බ...



## ඉන්ටර්විව්...

**මාගරට් -** ඔයාට මුලින්ම නම් හම්බෙන්නෙ රුපියල් 18000.00 ක් වගේ මුදලක් තමයි... ඒත් අවුරුද්දකට පස්සෙ පඩිය රුපියල් 50000.00 ක් බවට පත්වෙනවා...

**කසුන් -** ස්තුතියි මැඩම්... එහෙනම් මම අවුරුද්දකට පස්සෙ ඇවිත් ජොයින්ට් වෙන්නම්...



## සීයා මලා...


**සීයා -** කොලුවෝ... උඹ අද ඉස්කෝලෙ ගියෙ නැද්ද...?

**සුගත් -** සීයට ඒකෙන් වැඩක් නෑනෙ... මම අද එන්නෙ නෑ කියල ටීචට කෝල් එකක් දුන්නා...

මඳ වේලාවකට පසු...

**සීයා -** කොලුවෝ... හැංගියන්... අන්න උඹලගෙ ටීචර් මේ පැත්තට එනව... උඹ අද හොර ලෙඩක් අරගෙන කට්ටි පැන්න නේද...?

**සුගත් -** මම නෙමෙයි සීයෙ... ඔයා හැංගෙන්න... මම ටීචට කිව්වෙ සීයා මැරුණා කියල... ඒ නිසා ඉස්කෝලෙ එන්ඩ වෙන්නෑ කිව්වා...



## චොක්ලට් කෑම...

පොඩි එකෙක් බස් එකේ යනකොට චොක්ලට් එකක් කකා යනවලු... ඒක ඉවර උන ගමන් තව චොක්ලට් එකක් ගත්තලු... ඒක ඉවර උන ගමන් තවත් චොක්ලට් එකක් කන්න ගත්තලු... ඕක දිහා බලාගෙන හිටපු මාටිං කියල මනුස්සයෙක් ඒ පොඩි එකාට මෙහෙම කිව්වලු...

**මාටිං -** දරුවො... ඔය විදියට චොක්ලට් කන්න ගියොත් ඔයාගෙ දත් ටික ඔක්කොම නරක් වෙයි හොඳේ...

**පීටර් -** පිස්සු... අපේ ආච්චි අවුරුදු 110 ක් ජීවත්වුණා...

**මාටිං -** ආච්චි චොක්ලට් කාලද අවුරුදු 110 ක් ජීවත්වුණේ...?

**පීටර් -** නෑ... අපේ ආච්චි ඔය එක එකාගෙ ජීවි හොයන්ඩ ගියෙ නෑ... පාඩුවෙ හිටියනෙ... ඒකයි...



# ENGLISH Vision...

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රචාවක භාවිතය පිළිබඳව මෙම කලාපය තුළින් අවධානය යොමු කරමු.

## It is nice to

යම්කිසි කාර්යයක් කිරීමේදී එය ඉතා කදිමයි, එය ඉතා සතුටුයි යන අර්ථය ප්‍රකාශ කිරීම සඳහා මෙම වාක්‍යය රචාව භාවිතා කළ හැකිය.

***Fomular*** :- සූත්‍රය

> **It is nice to + Verb (Infinitive) + Object + Rest.**
> ඉට් ඊස් නයිස් ටු + වර්බ්(ඉන්ෆිනිටිව්)+ ඔබ්ජෙක්ට් + රෙස්ට්.
> එය ඉතා කදිමයි, එය ඉතා සතුටුයි + ක්‍රියාපදය + කර්මය + ඉතිරිය.

***Ex*** / *උදා* :-

1. It is nice to meet you.
   ඉට් ඊස් නයිස් ටු මීට් යූ.
   ඔබ හමුවීම සතුටක්.

2. It is nice to hear about your family.
   ඉට් ඊස් නයිස් ටු හියර් එබවුට් යුවර් ෆැමිලි.
   ඔබේ පවුලේ විස්තර දැනගැනීම සතුටුයි.

3. It is nice to meet her in the party.
   ඉට් ඊස් නයිස් ටු මීට් හර් ඉන් ද පාර්ටි.
   සාදයේදී ඇය හමුවීම සතුටක්.

4. It is nice to associate you.
   ඉට් ඉස් නයිස් ටු ඇසෝසියේට් යූ.
   ඔබ ඇසුරු කිරීම සතුටුයි.

***Nota Bene*** / සැ:යු :-

ඉහත වාක්‍යයන්හි අර්ථය හා භාවිතයන් පිළිබඳ සැලකීමේදී කාල අර්ථයෙන් එම වාක්‍යය භාවිතා වී ඇති බව වටහාගත හැක. මෙම වාක්‍යය රචාව භාවිතා කිරීමේදී,

- **It is nice to** :- "එය ඉතා කදිමයි, එය ඉතා සතුටුයි" ආදී වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම කණ්ඩය කිසිදු වෙනසකින් තොරව වාක්‍යයේ භාවිතා වේ.

- **Verb** :- ක්‍රියා පදය වාක්‍යයේ භාවිතා කිරීමේදී *infinitive* ක්‍රියා පදයක් ලෙස භාවිතා කළ යුතුය.

- **Object** :- කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන බලපෑම් ලබන පුද්ගලයෙකු හෝ දෙයක් වේ නම් එය කර්ම පදය ලෙස වාක්‍යයෙහි ඒකවචන, බහුවචන භේදයකින් තොරව භාවිතා වේ.

- **Rest** :- ඉතිරිය වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

> **It is nice to + Verb (Infinitive) + Object + Rest.**
> ඉට් ඊස් නයිස් ටු + වර්බ්(ඉන්ෆිනිටිව්)+ ඔබ්ජෙක්ට් + රෙස්ට්.
> එය ඉතා කදිමයි, එය ඉතා සතුටුයි + ක්‍රියාපදය + කර්මය + ඉතිරිය.

It is nice to meet you.
ඉට් ඊස් නයිස් ටු මීට් යූ.
ඔබ හමුවීම සතුටක්.

ප්‍රායෝගික අභ්‍යාස සඳහා වාක්‍ය නිර්මාණය කර වාක්‍ය රචාවෙහි භාවිතය මැනවින් අවබෝධකර ගනිමු.

***" English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමඟ එක්වන්න. තවද ඔබට මඟ හැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

කපිතාන් චමින්ද ලියනගේ
ශ්‍රීලංකාපොළිස්
සංඥා පුහුණු පාසල - මුවලිතබ
www.englishvision.lk



# වාද්දුව වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනක්...

**58 වන පාබල සේනාංකය** යටතේ පාලනය වන **582 වන පාබල බලසේනාවට** අයත් 9 වන ගැමුණු හේවා බලඇණියේ හටපිරිස් වාද්දුව ඉදිරිපස වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනකට එක්වූහ. පසුගියදා ගිනිගෙන දැවුණු එක්ස්ප්‍රස් පර්ල් නෞකාවෙන් වෙරළ තීරය වෙත ගොඩගසා ඇති සුන්බුන් ඉවත් කිරීම එහි අරමුණ විය.






රණවිරුවා

පරිගණක අකුරු සංයෝජනය,
කවර නිර්මාණය හා පිටු සැකසුම
සෙ/752158 බනි II සේනාරත්න ජීසී
3 ඉංජේරු
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ
එම්ජීඑම් 11 ඉංජේරු
සෙ/754676 ලාන්ස් කෝප්‍රල්
ලක්තිලක ඩබ්ලිව්ආර් 11 ඉංජේරු

රණවිරුවා ලිපිනය

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ
මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

ඊමේල්
dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

දුරකථන
011 2993076

යුධ දිගුව
51445/51446

ප්‍රකාශනය
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම්
අධ්‍යක්ෂ මණ්ඩලය






අධීක්ෂණය

බ්‍රිගේඩියර් ඊඩබ්ලිව්ඩී සෙනෙවිරත්න
යූඑස්පී පීඑස්සී



උපදේශකත්වය

ලුතිනන් කර්නල් ඩීඑම්ඩබ්ලිව් දිසානායක
ආර්ඩබ්ලිව්පී



ප්‍රධාන සංස්කාරක

මේජර් සුජිත චමින්ද එදිරිසිංහ
ශ්‍රීලංයොපාදුසේබ



සහාය සංස්කාරක

කපිතාන් කේඩීඑම් පැරකුම් ශ්‍රීලයුකාබ

# දක්ෂිණ එන්නත්කරණ මධ්‍යස්ථානවල සංචාරයක...







යුද්ධ හමුදා හටපිරිස් මේ වනවිට දිවයින පුරා පිහිටි කොවිඩ්-19 එන්නත්කරණ මධ්‍යස්ථානවල රාජකාරීන් සඳහා යොදවා ඇති අතර, ඔවුන් ගාල්ල, මාතර, මාතලේ, කුරුණෑගල සහ අනුරාධපුරය මෙන්ම උතුරු මැද වයඹ සහ මධ්‍යම පළාත්වල පිහිටි මධ්‍යස්ථානවල එම ක්‍රියාදාමය සඳහා සම්බන්ධවී ඇත. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ඉකුත් මැයි 27 වන දින උදෑසන **ඇල්පිටිය සහ හබරාදුව** එන්නත්කරණ මධ්‍යස්ථානයන්හි සංචාරයක නිරත වෙමින් එම වැඩපිළිවෙල නිරීක්ෂණය කළේය.





## උතුරු බිම රකින රණවිරු දියණියන් ...

# "විශේෂ ක්ෂණික ප්‍රතික්‍රියා ධාවන පැදි කණ්ඩායම"

හදිසි ආපදා තත්වයන් මැඩපැවැත්වීම, කොරෝනා වෛරසය පැතිරීම වැළැක්වීම හා පාලනය කිරීමේ අරමුණින් 7 වන කාන්තා බලකායේ නිලධාරිනියන් සහ සෙබලියන්ගෙන් සමන්විත **විශේෂ ක්ෂණික ප්‍රතික්‍රියා ධාවන පැදි කණ්ඩායමක්** පසුගියදා ස්ථාපිත කෙරිණ.

යාපනය ආරක්ෂක සේනා ආඥාපති මෙන්ම යුද්ධ හමුදා කාන්තා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක මෙම ක්ෂණික ප්‍රතික්‍රියා ධාවන පැදි කණ්ඩය 7 වන කාන්තා බලකායේ අණදෙන නිලධාරිනී මේජර් ජේආර්පීකේ ගල්හේන ගේ පූර්ණ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.